කාර්යසාධන වාර්තාව - 2023

වැය ශීර්ෂ අංකය : 238

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

කොළඹ 01

පටුන

1.0 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 4

1.1 හැඳින්වීම 4

1.2 දැක්ම හා මෙහෙවර 4

1.3 අරමුණු හා කාර්යයන් 4

1.4 සංවිධාන සටහන 5

2.0 ප්‍රගතිය, අභියෝග හා ඉලක්ක 6

2.1 සමාලෝචනය 6

2.2 රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය 6

2.3 රාජ්‍ය ආදායම් 8

2.4 බදු ප්‍රතිසංස්කරණ 10

2.5 බදු පරිපාලන ක්‍රියාමාර්ග 10

2.6 බදු ආදායම් කාර්යසාධනය 11

2.6.1 ආදායම් බදු 11

2.6.2 එකතු කළ අගය මත බද්ද 12

2.6.3 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද 12

2.6.4 නිෂ්පාදන /සුරා බද්ද 12

2.6.5 රේගු ආනයන බද්ද 14

2.6.6. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද 14

2.6.7 වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද 15

2.6.8 වෙළෙඳ භාණ්ඩ අපනයන සහනාධාර ක්‍රමය යටතේ වන බද්ද (සෙස් බද්ද) 15

2.6.9 වෙනත් බදු 15

2.7 බදු නොවන ආදායම 16

3.0 2023දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය 29

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 29

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 30

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 31

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 32

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - 33

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 33

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදනය කරන ලද ප්‍රතිපාදන 33

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 34

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 35

4.0 කාර්ය සාධන දර්ශක 45

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 45

5.0 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ කාර්යසාධනය 48
5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 48
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 49
6.0 මානව සම්පත් පැතිකඩ 49
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 49
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න. 49
6.3 මානව සම්පත් සංවර්ධනය 49
6.3.1 දේශීය පුහුණු 49
6.3.2 විදේශ පුහුණු....................50
7.0 අනුකූලතා වාර්තාව 52

වගු

වගුව 1: රාජ්‍ය ආදායම් සාරාංශය 8
වගුව 2: රාජ්‍ය බදු ආදායම 9
වගුව 3: එකතු කළ අගය මත බදු ආදායම 12
වගුව 4: සුරා බදු ආදායම 13
වගුව 5: මත්පැන් මත නිෂ්පාදන බද්ද සංශෝධනය කිරීමේ ව්‍යුහය.................... 13
වගුව 6: ජාත්‍යන්තර වෙළඳ කටයුතු මඟින් ඉපැයූ සෙස් බදු ආදායම සහ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා රජයේ සහනාධාර: 2021 - 2023 15
වගුව 7: බදු නොවන ආදායම් 16

රූප සටහන්

රූප සටහන 1: සමස්ථ රාජ්‍ය මූල්‍ය ශේෂයන් (ද. දේ. නි. % ලෙස) 6
රූප සටහන 2: රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් - 2023.................... ..7
රූපසටහන 3: රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් - 2022 / 2023 ද. දේ. නි. ප්‍රතිශතයක් ලෙස 7
රූපසටහන 4: ආදායම් කාර්යසාධනය 9
රූපසටහන 5: මත්පැන් නිෂ්පාදනය සහ නිෂ්පාදන/ සුරාබදු ආදායම 14
රූපසටහන 6: දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම 14

1.0 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වනුයේ අපේක්ෂිත ආර්ථික හා සමාජයීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අදාළ ආයතන, රේඛීය අමාත්‍යාංශ සහ පෞද්ගලික අංශය සමඟ මනා සම්බන්ධීකරණයෙන් යුතුව රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි.

රටේ බදු ප්‍රතිපත්තිය සැකසීම මෙන්ම ආදායම්, වියදම් සහ මූල්‍ය විශ්ලේෂණය හා දේශීය සහ විදේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි සුදුසු පරිදි වෙනස්කම් සිදුකිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමයි.

1.2 දැක්ම හා මෙහෙවර

දැක්ම

''තිරසර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ස්ථාපිත වීම සහතික කිරීම.''

මෙහෙවර

''රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.''

1.3 අරමුණු හා කාර්යයන්

- පෞද්ගලික, රාජ්‍ය සහ ජාත්‍යන්තර නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ මධ්‍යකාලීන මූල්‍ය රාමුව සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- තීරුබදු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හැර බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණපනත් සම්පාදනය කිරීම.
- ආදායම් රැස්කරන සියළුම දෙපාර්තමේන්තු සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් රාජ්‍ය ආදායම සහ ලැබීම් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය කිරීම.
- ආදායම් රැස්කරන දෙපාර්තමේන්තු හා ජාතික අයවැය සහ මූල්‍ය ක්‍රියාත්මක කරන දෙපාර්තමේන්තු සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.
- රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට අනුව නීතිමය සංශෝධන කිරීමට අදාළ කටයුතු ක්‍රියාවට නැංවීම.
- සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව 2003 අංක 03 දරන දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම.
- සාර්ව ආර්ථික ඒකකයේ සහාය ඇතිව විවිධ රාජ්‍ය මූල්‍ය සහ සාර්ව ආර්ථික ක්‍රියා විශ්ලේෂණය සහ පර්යේෂණ සිදුකිරීම.
- අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, පනත් සංශෝධනය හා ගැසට් නිවේදන පිළියෙල කිරීම.

1.4 සංවිධාන සටහන



අතිරේක අ.ජ.	- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
නි.අ.	- නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අ.	- සහකාර අධ්‍යක්ෂ
ප.නි.	- පරිපාලන නිලධාරී
භා.ප.	- භාෂා පරිවර්තක
සං.නි.	- සංවර්ධන නිලධාරී
ප්‍ර.ක.සේ.නි.	- ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ක.සේ.නි.	- කළමනාකරණ සේවා නිලධාරී
කා.කා.ස.	- කාර්යාල කාර්ය සහායක

2.0 ප්‍රගතිය, අභියෝග හා ඉලක්ක

2.1 සමාලෝචනය

රු. බිලියන 173.3 ක හෝ දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි. යෙහි) ප්‍රතිශතයක් ලෙස සියයට 0.6 ක ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් වාර්තා කරමින් හා 2022 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.2 ක් වූ සමස්ත අයවැය හිඟය 2023 වසරේ දී සියයට 8.3 කට පහත වැටීමත් සමඟ, රාජ්‍ය මූල්‍ය අංශය 2023 වසරේ දී අති විශාල වර්ධනයක් වාර්තා කරන ලදී. ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම 2022 වසරේ දී සියයට 8.4 සිට 2023 වසරේ දී සියයට 11.1 දක්වා වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු විය. ආදායම් මූලික රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා හේතුවෙන් 2023 වසරේ පළමු කාර්තුවේ රු. බිලියන 635.3 ක සිට 2024 වසරේ පළමු කාර්තුවේ දී රු. බිලියන 916.2 ක් දක්වා සියයට 44.2 ක වැඩි වීමක් සමඟ රාජ්‍ය ආදායම තවදුරටත් ශක්තිමත් වී තිබේ. ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය ද 2022 වසරේ දී සියයට 114.2 සිට 2023 වසරේ දී සියයට 103.9 ක් දක්වා අඩු වී ඇත.

රූපසටහන් 1: සමස්ථ රාජ්‍ය මූල්‍ය ශේෂයන් (ද. දේ. නි. % ලෙස)



මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව

2.2 රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය

2023 වසරේ දී රාජයේ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සැළකිය යුතු ලෙස වර්ධනය විය. ප්‍රදාන ද ඇතුළු සමස්ත රාජ්‍ය ආදායම 2022 වසරේ දී රු. බිලියන 2,012.6 ක සිට 2023 වසරේ දී රු. බිලියන 3,074.3 ක් දක්වා රු. බිලියන 1,061.7 කින් එනම් සියයට 52.8 කින් වැඩි විය. සමස්ත වියදම, 2022 වසරේ දී රු. බිලියන 4,472.6 ක සිට 2023 වසරේ දී රු. බිලියන 5,356.6 ක් දක්වා රු. බිලියන 884 කින් එනම් සියයට 19.8 කින් වැඩි විය. ඒ අනුව, අයවැය හිඟය රු. බිලියන 2,460 සිට රු. බිලියන 2,282,3 දක්වා අඩු විය.

වියදම වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන ලද්දේ, දේශීය පොළී අනුපාත ඉහළ යාම හේතුවෙන් පොළී ගෙවීම සඳහා වන වියදම රු. බිලියන 890.4 කින් එනම් සියයට 56.9 කින් වැඩි වීම වේ. ඒ අනුව, පොළී ගෙවීම සඳහා වන වියදම ඇතුළත් නොවන ප්‍රාථමික ගිණුමේ 2023 වසර සඳහා රු. බිලියන 173.3 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. එය 2022 වසරේ දී වාර්තා කරන ලද රු. බිලියන 894.8 ක ප්‍රාථමික හිඟය හා සසඳන විට සැළකිය යුතු වර්ධනයකි.

රූපසටහන 2: රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් - 2022 / 2023



මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස, ප්‍රදාන ද ඇතුළුව ආදායම 2022 වසරේ දී සියයට 8.4 සිට 2023 වසරේ දී සියයට 11.1 දක්වා වැඩි විය. පොලී වියදම් සඳහා වන වියදම සියයට 6.5 සිට සියයට 8.9 දක්වා වැඩි වීමත් සමඟ වියදම 2022 වසරේ දී සියයට 18.6 ක් වූ වියදම 2023 දී සියයට 19.4 දක්වා වැඩි විය. ඒ අනුව, ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2022 වසරේ දී සියයට 10.2 සිට 2023 වසරේ දී සියයට 8.3 දක්වා අඩු විය. 2022 වසරේ දී වාර්තා වූ සියයට 3.7 ක ප්‍රාථමික හිඟයට සාපේක්ෂව, 2023 වසරේ දී සියයට 0.6 ක ප්‍රාථමික අතිරික්තයක් වාර්තා විය.

රූපසටහන 3: රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් - 2022 / 2023 ද. දේ. නි. ප්‍රතිශතයක් ලෙස



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2.3 රාජ්‍ය ආදායම්

2023 වසරේ දී වර්ධනය වූ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, බදු ආදායම ඉහළ යාමය. බදු ආදායම, 2022 වසරේ දී රු. බිලියන 1,751.1 සිට 2023 වසරේ දී රු. බිලියන 2,720.6 දක්වා රු. බිලියන 969.4 කින් හෙවත් සියයට 55.4 කින් ඉහළ යන ලදී. ද. දේ. නි. යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම 2022 වසරේ දී සියයට 7.3 සිට 2023 දී සියයට 9.8 දක්වා වැඩි විය.

ආදායම් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ආදායම් බදු ආදායම සියයට 70.7 කින් සහ භාණ්ඩ හා සේවා මත බදු ආදායම සියයට 62.1 කින් ඉහළ යාමයි. පුද්ගලික ආදායම් බදු ව්‍යුහය සංශෝධනය කිරීම සහ අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද අනිවාර්යය කිරීම ඇතුළුව 2023 වසරේ ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වූ සැළකිය යුතු ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන් ආදායම් බදු වලින් ලද ආදායම වැඩි විය. තවද, 2022 වසරේ ඔක්තෝබර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 24 සිට සියයට 30 දක්වා වැඩි කිරීම හා විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව ලබා දී තිබූ සහනදායි අනුපාත ඉවත් කිරීම හේතුවෙන් සංස්ථාපිත ආදායම් බදු ආදායම වැඩි විය.

2022 වසරේ ජූනි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 12 දක්වා ද, 2022 වසරේ සැප්තැම්බර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 15 දක්වා වැඩි කිරීම ද, 2022 වසරේ ඔක්තෝබර් මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ සීමාව වසරක් සඳහා රුපියල් මිලියන 300 සිට රුපියල් මිලියන 80 ක් දක්වා අඩු කිරීම ද හේතුවෙන් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම සියයට 50.0 කින් වැඩි විය. කෙසේ වෙතත්, 2023 වසරේ ඔක්තෝම්බර් මස දක්වා අඛණ්ඩව පැවති ආනයන සීමාවන්ගේ බලපෑම පෙන්නුම් කරමින් ආනයන මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම වැඩි වී ඇත්තේ සියයට 31.4 කින් පමණි.

නිෂ්පාදන/සුරා බදු ආදායම සියයට 37.1 කින් වැඩි විය. ඉන්ධන සඳහා වන නිෂ්පාදන බද්ද 2023 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ලීටරයක් රු. 25 ක් බැගින් ද, 2023 වසරේ ජූනි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ලීටරයක් තවත් රු. 25 ක් බැගින් ද ඉහළ දැමීම නිසා ඛනිජ තෙල් මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම සියයට 170.6 කින් වැඩි විය. ආර්ථිකය ස්ථාවර වීමත් සමඟ ූසෘ කේත පද්ධතිය ඉවත් කිරීම ඇතුළු ඉන්ධන භාවිතය පිළිබඳ කෝටා ක්‍රමය ක්‍රමයෙන් ලිහිල් කිරීම ද ඛනිජ තෙල් මත නිෂ්පාදන බදු ආදායමේ වර්ධනයට දායක විය. 2023 වසරේ ජනවාරි සහ ජූලි මාසවලදී මත්පැන් සහ දුම්වැටි සඳහා වන නිෂ්පාදන/සුරා බදු අනුපාත ද දෙවරක් වැඩි කරන ලදී. කෙසේ වුවද, 2023 වසරේ දී දුම්වැටි සහ මත්පැන් සඳහා නිෂ්පාදන/සුරා බද්දෙන් ලද ආදායම ඉහළ යන ලද්දේ පිළිවෙළින් සියයට 13.7 කින් සහ සියයට 3.1 කින් පමණකි. 2023 වසරේ දී ප්‍රධාන වශයෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද රු. බිලියන 216.2 ක ආදායම හේතුවෙන් අනෙකුත් භාණ්ඩ හා සේවා බදු ආදායම සියයට 263.6 ක වර්ධනයක් වාර්තා කර ඇත.

2023 වසරේ දී විදේශ වෙළඳාම මත බදුවලින් ලද ආදායම වාර්තා කරන ලද්දේ සියයට 14.1 ක වර්ධනයක් පමණි. 2023 වසරේ වැඩි කාලයක් තුල අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා අඛණ්ඩව ආනයන සීමා කිරීම් පවත්වා ගෙන යාම සමඟ තීරුබදු නොවන ආනයන බදු පියවරෙන් පියවර ඉවත් කිරීමේ බලපෑම් හේතුවෙන් වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද සහ සෙස් බද්දෙන් ලද ආදායම පිළිවෙලින් සියයට 2.8 කින් සහ සියයට 18.7 කින් පහත වැටුණි. තීරුබදු නොවන ආනයන බදු පියවරෙන් පියවර ඉවත් කිරීම හේතුවෙන් ආදායම් පහත වැටීම පියවා ගැනීම සඳහා බදු අනුපාත ඉහළ නැංවීම හේතුවෙන් රේගු ආනයන බද්දෙන් ලද ආදායම සියයට 110.2 කින් වැඩි විය.
බදු නොවන ආදායම සියයට 43.9 කින් රු. බිලියන 328.3 දක්වා වැඩි විය. බදු නොවන ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2022 වසරේ දී සියයට 0.9 සිට 2023 වසරේ දී සියයට 1.2 දක්වා වැඩි විය.

වගුව 1: රාජ්‍ය ආදායම් සාරාංශය

රු. මිලියන

අයිතමය	2020	2021	2022	2023 (අ)
මුළු ආදායම සහ ප්‍රදාන	**1,373,308**	**1,463,810**	**2,012,589**	**3,074,324**
මුළු ආදායම	**1,367,960**	**1,457,071**	**1,979,184**	**3,048,822**
බදු ආදායම	1,216,542	1,298,019	1,751,132	2,720,563
ආදායම් බදු	268,249	302,115	534,021	911,355
භාණ්ඩ හා සේවා මත බදු	586,650	646,068	875,995	1,420,089
විදේශ වෙළෙඳාම මත බදු	361,643	349,836	341,116	389,118
බදු නොවන ආදායම්	151,417	159,052	228,052	328,259
ප්‍රදාන	**5,348**	**6,740**	**33,405**	**25,502**
ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස				
ආදායම සහ ප්‍රදාන	**8.8**	**8.3**	**8.4**	**11.1**
මුළු ආදායම	**8.7**	**8.3**	**8.2**	**11.0**
බදු ආදායම	7.8	7.4	7.3	9.8
බදු නොවන ආදායම්	1.0	0.9	0.9	1.2
ප්‍රදාන	**0.0**	**0.0**	**0.14**	**0.09**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

රූපසටහන 4: ආදායම් කාර්ය සාධනය



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

සටහන: භාණ්ඩ හා සේවා මත වෙනත් බදු ආදායම සැළකිය යුතු ලෙස ඉහළ යාමට හේතු වූයේ, 2023 වසරේ දී රු. බිලියන 216.2 ක් වන සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් සමස්ත වසරේ දී ලද බලපෑමය.

එබැවින්, බදු ප්‍රතිපත්ති සහ බදු පරිපාලනය තවදුරටත් ශක්තිමත් කිරීමත් සමග ආදායමේ වර්ධනය අඛණ්ඩව පවත්වාගත යුතු අතර, වර්ධනය ඉහළ නංවන රාජ්‍ය ආයෝජන වෙත වියදම් වැඩි වශයෙන් යොමු කිරීම අවශ්‍ය වේ. දළ මූල්‍ය අවශ්‍යතා තවදුරටත් අඩුකිරීම සහ ඒ මඟින් රජයේ ණය මට්ටම අඩු කර ගැනීම මඟින් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ළඟා කර ගැනීම සඳහා මෙය ඉතා වැදගත් වේ.

වගුව 2: රජයේ බදු ආදායම - ප්‍රභවයන් අනුව

රු. මිලියන

මූලාශ්‍රය	2022	2023[අ]	2022/2023 වෙනස (%)
ආදායම් බදු	**534,021**	**911,355**	**70.7**
දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු	**590,315**	**927,544**	**57.1**
එකතු කළ අගය මත බදු - දේශීය	291,619	469,107	60.9
ජාතිය ගොඩනැගීමේ බදු - දේශීය	352	68	-80.6
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - දේශීය	23,358	164,915	606.0
සුරාබදු	165,188	170,260	3.1
දුම්වැටි සහ දුම්කොළ මත බදු	104,200	118,481	13.7
නිෂ්පාදන බදු - අනෙකුත්	5,598	4,713	-15.8
ආනයනය මත පදනම් වූ බදු	**592,960**	**842,164**	**42.0**
ආනයන බදු	50,009	105,120	110.2
එකතු කල අගය මත බදු - ආනයන	171,452	225,353	31.4
ජාතිය ගොඩනැගීමේ බදු - ආනයන	61	260	326.9
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - ආනය.	12,753	51,265	302.0
වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු	180,595	175,486	-2.8
විශේෂ වෙළඳ භාණ්ඩ බදු	40,194	51,327	27.7
සෙස් බදු	70,318	57,184	-18.7
නිෂ්පාදන බදු - ඛනිජ තෙල්	53,074	143,642	170.6
නිෂ්පාදන බදු - මෝටර් රථ	14,504	32,526	124.3
බලපත්‍ර සහ අනෙකුත්	**33,836**	**39,500**	**16.7**
විදුලි සංදේශ බදු	14,995	17,304	15.4
අනෙකුත්	18,841	22,195	17.8
මුළු බදු ආදායම	**1,751,132**	**2,720,563**	**186.6**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

2.4 බදු ප්‍රතිසංස්කරණ

2023 වසරේ ආදායමේ සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට හේතු වූ ආදායම් බදු, එකතු කළ අගය මත බදු සහ සුරාබදු සම්බන්ධයෙන් 2022 වසරේ ජුනි මාසයේ සිට හඳුන්වා දුන් ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර එය අතර මධ්‍ය කාලීනව වැඩි බදු ආදායමක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මධ්‍ය කාලීනව ආදායම ඉහළ යාමට හේතු වූ බදු ප්‍රතිසංස්කරණ 2024 වසරේ දී තවදුරටත් හඳුන්වා දෙන ලදි. එවැනි ප්‍රතිසංස්කරණ සඳහා ඇතුළත් වන්නේ:

- එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 18 දක්වා වැඩි කිරීම, එකතු කළ අගය මත බදු ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 60 ක් දක්වා අඩු කිරීම සහ 2024 වසරේ ජනවාරි මස 01 සිට බලපැවැත්වෙන පරිදි බදු නිදහස් කිරීම් බහුතරයක් ඉවත් කිරීම;

- සමාජ ආරක්ෂණ දායකත්ව බද්දේ ලියාපදිංචි සීමාව 2024 වසරේ ජනවාරි මස 01 සිට ක්‍රියාත්මක වන පරිදි වසරකට රු. මිලියන 120 සිට වසරකට රු. මිලියන 60 දක්වා අඩු කිරීම; සහ

- 2024 ජනවාරි 1 සිට බලපැවැත්වෙන පරිදි නිෂ්පාදන/සුරා බදු උද්ධමනය අනුව ස්වයංක්‍රීයව වෙනස් වන පරිදි දර්ශකයක් හඳුන්වා දීම

තවද, ආදායමට හානියක් නොවන ආකාරයෙන්, සෙස් බද්ද සහ වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්ද පිළිවෙලින් වසර තුනක් සහ පහක් ඇතුළත ක්‍රමානුකූලව ඉවත් කිරීම අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක කර ගෙන යනු ඇත. සකස් කර අවසන් කිරීමට ආසන්නව පවතින නව ජාතික තීරුබදු ප්‍රතිපත්තිය මඟින්, පාරිභෝගිකයින්, අපනයනකරුවන්, දේශීය නිෂ්පාදකයින්ගේ අභිලාශයන් සහ රජයේ ආදායම් අවශ්‍යතා අතර උචිත සමතුලිතතාවයක් ඇති කරන විනිවිද භාවයෙන් යුතු සහ පුරෝකථනය කළ හැකි නව විදේශ තීරුබදු රාමුවක් ඉදිරිපත් කරනු ඇත.

2.5 බදු පරිපාලන ක්‍රියාමාර්ග

- මෑත කාලීනව බදු ප්‍රතිපත්තියට හඳුන්වා දුන් ප්‍රධාන ප්‍රතිසංස්කරණවලින් පසුව, බදු පරිපාලනය හා අනුකූලතාවය වැඩි කිරීම සඳහා වන අඛණ්ඩ ක්‍රියාමාර්ග මඟින් ඉදිරියේ දී ආදායම් ඉහළ නැංවීම ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ඇතැයි අපේක්ෂා කෙරේ. බදු අනුකූලතාව වැඩි කිරීම, බදු ආදායම් අහිමි වීම අඩු කිරීම සහ දූෂණ අවදානම් අවම කිරීම සඳහා පසුගිය වසර දෙක තුළ රජය විසින් බදු පරිපාලන ක්‍රියාමාර්ග මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. ඒවායින් ප්‍රධාන බදු පරිපාලන ක්‍රියාමාර්ග පහත පරිදි වේ;

- වයස අවුරුදු 18 ට වැඩි සියලුම තැනැත්තන්ට බදු හඳුනාගැනීමේ අංකයක් (Tax Identification Number) සඳහා ලියාපදිංචි වීම අනිවාර්ය කිරීම.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතියේ (RAMIS) 2.0 අනුවාදය ක්‍රියාත්මක කිරීම

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ බදු ගෙවීම, ගොනු කිරීම, වාර්තා කිරීම සහ ලියාපදිංචිය පිළිබඳව මැනිය හැකි ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හඳුන්වා දීම.

- නියමිත වේලාවට බදු ගොනු කිරීම සහ බදු ගෙවීම සහතික කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි විශාල බදු ගෙවන්නන්ගේ ඒකකය තුළ ඉහළ වත්කම් සහිත පුද්ගලයන්ගේ ඒකකයක් (HWI), සැලසුම් සහ අධීක්ෂණ ඒකකයක් සහ ශක්තිමත් කරන ලද අවදානම් කළමනාකරණ ඒකකයක් ස්ථාපනය කිරීම.

- දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි විශාල බදු ගෙවන්නන් සඳහා අවදානම මත පදනම් වූ නවීන විගණන ක්‍රමවේදයක් හඳුන්වා දීම.

- සංකීර්ණ මෘදුකාංග විසඳුමක් සංවර්ධනය කිරීම මඟින් ශ්‍රී ලංකා රේගුවේ අවදානම් කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීම. ආදායම් අවදානම විනිශ්චය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම, රේගු නිෂ්කාශනයෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, අදාළ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සහ අනාගත අවශ්‍යතා සඳහා තිරසාර, අනුවර්තනය කළ හැකි මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.

- 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත් කිරීම මඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, රජයේ ප්‍රසම්පාදන ආයතන, මූල්‍ය ආයතන සහ කොළඹ කොටස් හුවමාරුව අතර තොරතුරු හුවමාරු කර ගැනීම ශක්තිමත් කිරීම.

පහත සඳහන් බදු පරිපාලන ක්‍රියාමාර්ග මධ්‍ය කාලීනව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- 2025 වසරේ දී සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම සඳහා එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම.
- එකතු කළ අගය මත බද්දෙහි අනුකූලතාවය වැඩි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- ආදායම් අහිමිවීම් අවම කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව එකිනෙක සම්බන්ධ කිරීම හරහා එකතු කළ අගය මත බද්ද සඳහා තාවකාලික ලියාපදිංචි කිරීම් අවම කිරීම.
- සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ඩිජිටල් ආදායම් පරිපාලන පද්ධතියක් සහ රේගුව තුළ තනි කවුළුව ක්‍රමවේදය (Single Window) හඳුන්වාදීම.
- ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) හරහා සියලුම බදු එකතු කිරීම් ක්‍රියාත්මක කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හැකියාව ලැබෙන පරිදි ක්‍රියාකාරීත්වයෙහි හා සැලස්මෙහි වැඩි දියුණු කිරීම් සහිතව ඍඑෂී 3.0 සංවර්ධනය කිරීම.
- චර්යාධර්ම සංග්‍රහයන් (Codes of Conduct) ශක්තිමත් කිරීම, අභ්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තු, අවදානම් කළමනාකරණය සහ ස්වයංක්‍රීයකරණය (automation) සමඟ ආදායම් එකතු කිරීමේ ආයතන තුළ දූෂණ විරෝධී ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම.
- ස්වාධීන ආදායම් අධිකාරියක් පිහිටුවීම.

මෙම බදු ප්‍රතිපත්ති සහ පරිපාලන ප්‍රතිසංස්කරණ හරහා ආදායම් ඉලක්ක තිරසාර ලෙස සපුරා ගැනීමට හැකි වූ පසු, ආදායම් ඉලක්ක සපුරා ගැනීමට බාධාවක් නොවන පරිදි බදු අනුපාත තාර්කිකකරණය කිරීමට හැකි වනු ඇත.

2.6 බදු ආදායම් කාර්යසාධනය

2.6.1 ආදායම් බදු

ආදායම් බදු මඟින් ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 534.0 සිට 2023 වසරේ දී රු. බිලියන 911.4 දක්වා සියයට 70.7 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය. පුද්ගල ආදායම් බදු (ඡෂඔ) සහ සංස්ථාපිත ආදායම් බදු (ක්‍ෂඔ) සංශෝධනය කිරීම සහ සේවානියුක්ති ආදායම මත අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ රඳවාගැනීමේ බදු සියළුම බදු ගෙවන්නන් සඳහා අනිවාර්ය කිරීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2023 වසර සඳහා ආදායම් බදුවලින් ලද ආදායම අපේක්ෂිත වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 105.5 කි. ආදායම් බද්දෙන් ලද ආදායම සමස්ත බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2022 වසරේ දී සියයට 30.5 සිට 2023 වසරේ දී සියයට 33.5 දක්වා වර්ධනය විය. සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු ආදායම 2022 වසරේ දී රු. බිලියන 488.4 සිට 2023 වසරේ දී රු. බිලියන 608.2 දක්වා සියයට 24.5 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. අවම බදු නිදහස් සීමාව ඉක්මවා යන සේවානියුක්තිකයන් සඳහා ක්‍රමයෙන් වර්ධනය වන පරිදි ඉහළ බදු අනුපාත හා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අනිවාර්යය කිරීම හේතුවෙන් නාමික වශයෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන්/ උපයන විට ගෙවීම මඟින් ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 25.5 සිට 2023 වසරේ දී රු. බිලියන 145.0 දක්වා සියයට 467.4 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය. සේවානියුක්ති ආදායම මත අනිවාර්යය රඳවා ගැනීමේ බදු අනුපාත නැවත පැනවීම, ලාභාංශ, පොලී හෝ වට්ටම් සහ කුලී ගෙවීම් සහ සේවා ගෙවීම් සඳහා (මසකට රු. 100,000 ඉක්මවන) අනිවාර්ය රඳවා ගැනීමේ බදු අනුපාත නැවත පැනවීම හේතුවෙන් රඳවා තබා ගැනීමේ බද්දෙන් ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 19.8 සිට 2023 වසරේ දී රු. බිලියන 157.9 දක්වා සියයට 696 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය. රඳවා තබා ගැනීමේ බද්දෙන් ලද ආදායම 2023 වසර සඳහා වන ඇස්තමේන්තුවෙන් සියයට 105.3 කි. ආදායම් බැද්දෙහි විවිධ සංරචකවලින් ලද ආදායම ඉහත පරිදි සැළකිය යුතු ලෙස වර්ධනය වුවද, දේපළ වෙළඳාම් අංශයේ පැවැති පහළ කාර්යසාධනය හේතුවෙන් 2022 වසරේ දී රු. බිලියන 5.3 ක් වූ ප්‍රාග්ධන ලාභ බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 2.7 දක්වා අඩු විය.

2.6.2 එකතු කළ අගය මත බද්ද

ප්‍රධාන වශයෙන්ම, 2022 වසර අග භාගයේ දී එකතුකළ අගය මත බදු අනුපාතය වැඩි කිරීම හා එකතුකළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම හේතුවෙන් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම නාමික වශයෙන් 2022 වසරේ දී රු. බිලියන 463.1 සිට 2023 වසරේ දී රු. බිලියන 694.5 දක්වා සියයට 50.0 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. 2023 වසරේ දී දේශීය ක්‍රියාකාරකම් හා ආනයන යන දෙයාකාරයෙන්ම එකතුකළ අගය මත බදු ආදායම වැඩි විය. දේශීය ක්‍රියාකාරකම් මත එකතුකළ අගය මත බද්දෙන් රැස්කළ ආදායම 2022 වසරේ දී රු. බිලියන 291.6 සිට 2023 වසරේ දී රු. බිලියන 469.1 දක්වා සියයට 60.9 කින් වර්ධනය වූ අතර, ආනයන මත එකතුකළ අගය මත බද්දෙන් ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 171.5 සිට 2023 වසරේ දී රු. බිලියන 225.4 දක්වා සියයට 31.4 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, 2023 වසරේ සැළකිය යුතු කාලසීමාවක් තුළ ආනයන සීමා බහුතරයක් තවදුරටත් ක්‍රියාත්මක වීම හේතුවෙන්, එකතුකළ අගය මත බද්ද සඳහා සිදුකරන ලද ප්‍රතිසංස්කරණයන්ගේ බලපෑම ආනයන මත එකතුකළ අගය මත බද්දෙන් ලද ආදායමේ වැඩිවීම මගින් පූර්ණ වශයෙන් පිළිබිඹු නොවිය.

සමස්ත බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස එකතුකළ අගය මත බදු ආදායම 2022 වසරේ දී සියයට 26.4 සිට 2023 වසරේ දී සියයට 25.5 දක්වා සුළු වශයෙන් අඩු වූ අතර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එකතුකළ අගය මත බදු ආදායම 2022 වසරේ දී සියයට 1.9 සිට 2023 වසරේ දී සියයට 2.5 දක්වා කැපී පෙනෙන ලෙස වැඩි විය.

වගුව 3: එකතු කල අගය මත බදු ආදායම

රු. මිලියන

අයිතමය	2018	2019	2020	2021	2022	2023(අ)
දේශීය	283,327	275,089	150,823	185,918	292,293	469,768
ආනයන	179,163	169,914	85,727	122,766	171,478	225,401
දළ ආදායම	**462,490**	**445,003**	**236,550**	**308,684**	**463,771**	**695,169**
ආපසු ගෙවීම	840	1,126	2,764	471	699	709
ශුද්ධ ආදායම	**461,651**	**443,877**	**233,786**	**308,213**	**463,072**	**694,460**
ශුද්ධ ආදායම ද.දේ.නි.% ලෙස	**3.0**	**2.8**	**1.5**	**1.8**	**1.9**	**2.5**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

2.6.3 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

2022 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අලුතින් හඳුන්වා දෙන ලද සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද, වාර්ෂික පිරිවැටුම රු. මිලියන 120.0 ඉක්මවනු ලබන ආනයනකරුවන්, නිෂ්පාදකයින්, සේවා සපයන්නන් සහ තොග වෙළෙන්දන් සහ සිල්ලර වෙළෙන්දන්ගෙන් බද්දට යටත් පිරිවැටුම මත සියයට 2.5 ක අනුපාතයකින් අය කරනු ලැබේ. 2023 වසර තුළ ආදායම සම්පූර්ණ වශයෙන් ලැබීමෙහි බලපෑම පිළිඹිබු කරමින්, 2022 වසරේ දී රු. බිලියන 36.1 ක් වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2023 වසරේ දී රු. බිලියන 216.2 දක්වා සැළකිය යුතු ලෙස වර්ධනය විය. 2023 වසරේ දී සමස්ත බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම සියයට 7.9 ක් විය.

2.6.4 නිෂ්පාදන/ සුරා බද්ද

2023 වසරේ දී නිෂ්පාදන/සුරා බදු මඟින් ලද සමස්ත ආදායම සියයට 37.1 ක කැපීපෙනෙන වර්ධනයක් පෙන්විය. 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී අදාළ නිෂ්පාදනවල නිෂ්පාදන බදු අනුපාත ඉහළ නැංවීමත් සමඟ ප්‍රධාන වශයෙන්ම ඛනිජතෙල් නිෂ්පාදන සහ මෝටර් වාහන මඟින් ලද ඉහළ ආදායම මෙම වර්ධනයට මූලික වශයෙන් හේතු විය. මිල ඉහළ දැමීමේ ගැලපීම් සහ ආර්ථික ස්ථායිතාව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමත් සමඟ QR පද්ධතිය මඟින් පරිපාලනය කරන ලද ඉන්ධන කෝටාව පියවරෙන් පියවර ඉවත් කිරීම මත භාවිත කරන ලද ඉන්ධන ප්‍රමාණය වැඩිවීම හේතුවෙන් ඛණිජ තෙල් නිෂ්පාදන මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම ඉහළ යන ලදී. ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රේෂණ ඉහළ නැංවීමේ අරමුණ ඇතිව විදේශයන්හි සේවයෙහි නියුතු පුද්ගලයින් දිරි ගැන්වීම සඳහා ඔවුන්ට මෝටර් රථ ආනයනය කිරීමට අවස්ථාව ලබාදීම හේතුවෙන් මෝටර් රථ මත නිෂ්පාදන බද්ද මඟින් ලද ආදායම වර්ධනය විය.

වගුව 4: නිෂ්පාදන / සුරා බදු ආදායම

රු.මිලියන

අයිතමය	2018	2019	2020	2021	2022	2023(අ)
මත්පැන්	113,944	115,443	120,990	138,637	165,188	170,260
දුම්වැටි	92,198	87,367	94,345	88,539	104,160	117,467
මෝටර් වාහන	204,081	130,378	48,760	18,113	14,504	32,526
ඛනිජ තෙල් නිෂ්පාදන	66,318	61,740	53,111	55,339	53,074	143,642
අනෙකුත්	7,701	4,549	4,727	6,234	5,598	4,713
එකතුව	**484,242**	**399,478**	**321,932**	**306,861**	**342,523**	**468,608**

මූලාශ්‍රය: රාජ්‍ය මූලය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

නිෂ්පාදන බදු අය කළ හැකි සියලුම ප්‍රධාන කාණ්ඩවලින් ලද ආදායම වැඩිවීම හේතුවෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස නිෂ්පාදන/සුරා බද්දෙන් ලද ආදායම 2022 වසරේ දී සියයට 1.4 සිට 2023 වසරේ දී සියයට 1.7 දක්වා වැඩි විය. නාමික වශයෙන්, නිෂ්පාදන/සුරා බදු ආදායම 2022 වසරේ දී රු. බිලියන 342.5 ට සාපේක්ෂව රු. බිලියන 469.6 ක් දක්වා සියයට 37.1 කින් කැපීපෙනෙන වර්ධනය විය. මෙම වර්ධනයට පටහැනිව, සමස්ත බදු ආදායම තුළ ආදායම් බදු සහ එකතු කළ අගය මත බදු වැනි අනෙකුත් බදු සීඝ්‍රයෙන් වර්ධනය වීම හේතුවෙන් 2023 වසරේ දී සමස්ත බදු ආදායමට නිෂ්පාදන/සුරා බදු ආදායම දක්වන ලද දායකත්වය 2022 වසරේ දී සියයට 19.6 සිට 2023 වසරේ දී සියයට 17.3 දක්වා අඩු විය. කෙසේ වෙතත්, 2023 වසරේ දී වාර්ෂික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 104.4 ක නිෂ්පාදන/සුරා බදු ආදායමක් ළඟා කර ගැනීමත් සමඟ රාජ්‍ය ආදායමට දායකත්වය දක්වන තුන්වන විශාලතම දායකයා ලෙස නිෂ්පාදන/සුරා බදු තවදුරටත් සිය ස්ථානය තහවුරු ගැනීමට සමත්ව තිබේ.

මත්පැන් මත සුරා බද්දෙන් ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 165.2 සිට 2023 වසරේ දී රු. බිලියන 170.3 දක්වා සියයට 3.1 කින් සුළු වශයෙන් පමණක් වැඩි විය. කෙසේ වෙතත්, මධ්‍යසාර නිෂ්පාදනය 2022 වසරේ දී නිරපේක්ෂ ලීටර් මිලියන 41.2 සිට 2023 වසරේ දී නිරපේක්ෂ ලීටර් මිලියන 34.0 දක්වා සියයට 17.5 කින් අඩු විය. විශේෂයෙන්ම ආරක්ෂක සලකුණු සහ ආරක්ෂක සලකුණු කළමනාකරණ පද්ධතියේ ඇති ගැටලු විසඳීම සඳහා නිසි අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මඟින් බදු පරිපාලනය තවදුරටත් ශක්තිමත් කිරීමේ වැදගත්කම මෙයින් පිළිඹිබු කෙරේ.

වගුව 5: මත්පැන් මත නිෂ්පාදන බද්ද සංශෝධනය කිරීමේ ව්‍යුහය

මත්පැන් වර්ගය	නිරපේක්ෂ ලීටරයක් සඳහා පෙර තීරුබදු (රු.) (2023 ජූලි 1ට පෙර)	නිරපේක්ෂ ලීටරයකට නව තීරුබදු (රු.) (2024 ජනවාරි 01 න් පසු)	ප්‍රතිශතයක් ලෙස වැඩිවීම
විශේෂ අරක්කු	6,000	6,840	
මොලැසස් / තල් / පොල් අරක්කු	6,420	7,320	
රට නිෂ්පාදිත විදේශ මත්පැන්	6,600	7,525	
බියර් (ශක්තිය - 5% ට අඩු)	4,750	5,415	
ශක්තිමත් බියර් (ශක්තිය - 5% ට වැඩි හෝ සමාන)	4,980	5,680	14
වයින්	4,750	5,415	
සකේ	1,300	1,480	
කිරි පොන්සා	3,300	3,760	
සයිඩර්	3,600	4,105	

මූලාශ්‍රය: රාජ්‍ය මූලය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

රූපසටහන 5:
මත්පැන් නිෂ්පාදනය සහ නිෂ්පාදන/ සුරාබදු ආදායම



රූපසටහන 6:
දුම්වැටි නිෂ්පාදනය සහ නිෂ්පාදන බදු ආදායම



ඇතැම් වාහන කාණ්ඩ සඳහා පනවා තිබූ තාවකාලික ආනයන සීමා ලිහිල් කිරීම හේතුවෙන් මෝටර් වාහන මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 14.5 සිට 2023 වසරේ දී රු. බිලියන 32.5 දක්වා සියයට 124.3 ක සැළකිය යුතු වර්ධනයක් පිළිබිඹු කර ඇත. ප්‍රධාන වශයෙන්ම, 2023 වසරේ ජනවාරි මස 01 වන දින හා ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක කරන ලද දුම්වැටි මත වූ නිෂ්පාදන බද්ද ඉහළට සංශෝධනය කිරීම හේතුවෙන් දුම්වැටි මඟින් ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 104.2 සිට 2023 වසරේ දී රු. බිලියන 117.5 දක්වා සියයට 12.8 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. කෙසේ වෙතත්, දුම්වැටි අලෙවිය 2022 වසරේ දී දුම්වැටි මිලියන 2,825.3 සිට 2023 වසරේ දී දුම්වැටි මිලියන 2,303.2 දක්වා සියයට 18.5 කින් අඩු වී ඇත.

ඛනිජතෙල් නිෂ්පාදන මඟින් උපයාගත් ආදායම 2022 වසරේ දී රු. බිලියන 53.1 සිට 2023 වසරේ දී රු. බිලියන 143.6 දක්වා සියයට 170.6 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. සළකා බලන ලද කාල සීමාව තුළ ප්‍රධාන වශයෙන් පිරිපහදු නිෂ්පාදන හා බොරතෙල් ආනයනය වැඩිවීම මෙම කැපී පෙනෙන වර්ධනයට හේතුවී ඇත. මේ අතර, පැණි බීම, ශීතකරණ, පාම් තෙල් හා මේද අම්ල ඇතුළු අනෙකුත් නිෂ්පාදන බදු අයිතමවලින් ලද නිෂ්පාදන බදු ආදායම 2022 වසරේ දී රු. බිලියන 5.6 සිට 2023 වසරේ දී රු. බිලියන 4.7 දක්වා සියයට 15.8 කින් අඩු වී ඇත. අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ සඳහා 2023 වසරේ තුන්වන කාර්තුව දක්වා බලපැවැත්වුණු ආනයන සීමාකිරීම් මෙම අඩුවීමට විශාල වශයෙන් බලපාන ලදී.

2.6.5 රේගු ආනයන බද්ද

ප්‍රධාන වශයෙන්ම අත්‍යාවශ්‍ය හා අතරමැදි භාණ්ඩ ආනයන සීමා කිරීම් අර්ධ වශයෙන් ඉවත් කිරීම සඳහා වූ ප්‍රතිපත්ති ආපසු හැරවීම හා 2023 වසරේ මාර්තු මස 28 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි යෝජිත තීරුබදු නොවන ආනයන බදු පියවරෙන් පියවර ඉවත් කිරීමට ඉඩ සැළසීම පිණිස රේගු ආනයන බදු අනුපාත 0:10:15 සිට 0:15:20 දක්වා සංශෝධනය කිරීම හේතුවෙන් රේගු ආනයන බද්ද මඟින් උපයන ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 50.0 සිට 2023 වසරේ දී රු. බිලියන 105.1 දක්වා සියයට 110.2 කින් වැඩිවිය. ඇස්තමේන්තුවෙන් සියයට 119.5 ක් වාර්තා කරමින් 2023 වසරේ දී රේගු ආනයන බද්ද මඟින් උපයන ලද ආදායමේ ඉහළ කාර්යසාධනයක් පෙන්විය.

2.6.6. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද

සීනි, පරිප්පු හා ලොකු ලූණු ආනයන ප්‍රමාණයේ කැපීපෙනෙන වර්ධනය හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් රැස්කරගන්නා ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 40.2 සිට 2023 වසරේ දී රු. බිලියන 51.3 දක්වා සියයට 27.7 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. 2023 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව සියයට 2.7 කින් ඉක්මවා යමින් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මඟින් ලද ආදායම 2023 වසරේ දී ඉහළ කාර්යසාධනයක් පෙන්විය. කෙසේ වුවද, රජය විසින් විනිමය ප්‍රතිලාභ ග්‍රහණය කර ගැනීම සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද සම්පූර්ණයෙන්ම ගැලපීමකින් තොරව රුපියල අධිප්‍රමාණය වීමේ ප්‍රතිලාභය පාරිභෝගිකයන් වෙත ලබා දී ඇත.

2.6.7 වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද

වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් උපයාගත් ආදායම 2022 වසරේ රු. බිලියන 180.6 සිට 2023 වසරේ දී රු. බිලියන 175.5 ක් දක්වා සියයට 2.8 කින් ආන්තික ලෙස අඩුවිය. මෙයට ප්‍රධාන වශයෙන් ලෝක බැංකුවේ සංවර්ධන ණය ප්‍රතිපත්ති වැඩසටහන් ක්‍රියාමාර්ගයේ කොටසක් ලෙස වසර පහක් ඇතුළත සමාන වාරිකවලින් වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද ඉවත් කිරීම සඳහා වූ එකඟතාවය අනුව 2023 වසරේ අප්‍රේල් මස 03 වන දා සිට බලපැවැත්වෙන පරිදි වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද අදාළ වන සංයෝජිත සංකේතාංක 1,631 ක තීරුබදු ඉවත් කිරීම හේතු විය. 2023 වසර අගභාගය වනවිට වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද අදාළ වන මුළු අයිතමයන්ගෙන් සියයට 50.0 ක් පමණ නියෝජනය කරන සංයෝජිත සංකේතාංක 4,100 ක් පමණ අයිතමයන් වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. පෙට්‍රල් හා ඩීසල් ඇතුළු ඛනිජ තෙල්, තාර වශයෙන් පවතින ඛනිජ ද්‍රව්‍ය, තෙල්,කේක් සහ අනෙකුත් ඝන අපද්‍රව්‍ය, ධාන්‍ය වර්ග හා පොහොර 2023 වසරේ දී වරාය හා ගුවන් තොටුපොළ බද්ද සඳහා දායක වූ ප්‍රධාන අයිතම පහ ලෙස දැක්විය හැක.

2.6.8 වෙළෙඳ භාණ්ඩ අපනයන සහනාධාර ක්‍රමය යටතේ වන බද්ද (සෙස් බද්ද)

ආනයන හා අපනයන මඟින් එකතු වූ සෙස් බදු ආදායම 2022 වසරේ දී රු. බිලියන 70.3 සිට 2023 වසරේ දී රු. බිලියන 57.2 දක්වා සියයට 18.7 කින් සැළකිය යුතු ලෙස අඩු විය. අත්‍යාවශ්‍ය නොවන ආනයන කප්පාදු කිරීම ඉලක්ක කර ගනිමින් රජය විසින් ක්‍රියාත්මක කරන ලද සීමාකාරී ප්‍රතිපත්ති මඟින් ආනයන අඩු වීම හා 2023 වසරේ සිට වසර තුනක් ඇතුළත සෙස් බද්ද (තීරු බදු නොවන ආනයන බදු) ඉවත් කිරීම සඳහා රජය ගෙන ඇති තීරණය මෙම ආදායම අඩු වීමට මූලිකවම හේතු විය. ආනයන මඟින් එකතු වූ සෙස් බදු ආදායම 2022 වසරේ දී රු. බිලියන 68.1 සිට 2023 වසරේ දී රු. බිලියන 55.0 දක්වා සියයට 19.2 කින් අඩු වී ඇත. ලිහිසි තෙල් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන ලිහිසි තෙල් (මූලික තෙල්) 2023 වසරේ ආනයන සෙස් බදු ආදායම සඳහා ප්‍රධාන දායකත්වයක් ලබා දී ඇත. තව ද, බීඩි කොළ, ටයර්, අමුරෙදි, හා පෝට්ලන්ඩ් සිමෙන්ති සෙස් බද්දෙන් ලද ආදායම සඳහා ප්‍රධාන දායකත්වයක් දක්වන අනෙකුත් භාණ්ඩ වේ. අපනයන සෙස් බදු ආදායම 2022 වසරේ දී රු. බිලියන 2.24 සිට 2023 වසරේ දී රු. බිලියන 2.22 දක්වා ආන්තිකව අඩු වී ඇත. අපනයන සෙස් බදු ආදායමට දායකත්වය ලබා දුන් ප්‍රධාන නිෂ්පාදන වනුයේ තේ, ඉල්මනයිට්, පොල්, මිනිරන් හා ක්‍රේප් රබර් වේ. 2023 වසරේ රැස්කරගනු ලැබූ සෙස් බදු ආදායම රු. බිලියන 53.0 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 107.9 කි.

වගුව 6: ජාත්‍යන්තර වෙළඳ කටයුතු මඟින් ඉපැයූ සෙස් බදු ආදායම සහ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා රජයේ සහනාධාර: 2021 - 2023

රු.මිලියන

විස්තරය	2021	2022	2023 (අ)	විස්තරය	2021	2022	2023 (අ)
අපනයන සෙස් බද්ද	**2,223**	**2,243**	**2,229**	**වාණිජ භෝග සංවර්ධනය**	**24,056**	**64,074**	**55,961**
තේ - තේ (බදු සහ අපනයන පාලන) පනත,තේ මණ්ඩල නීති යටතේ	482	465	523	තේ	1,177	462	686
රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ	8	10	7	රබර්	897	652	655
පොල් - පොල් සංවර්ධන පනත යටතේ	180	189	186	පොල්	322	213	450
අ.සං.ම. සෙස් බද්ද - අපනයන සංවර්ධන පනත යටතේ	1,553	1,579	1,513	කජු	64	29	-
ආනයන මත සෙස් බද්ද	**73,320**	**68,076**	**54,955**	සුළු අපනයන භෝග (කුරුඳු, කොකෝවා, කෝපි, ගම්මිරිස්)	361	241	388
අපනයන සෙස් බද්ද - අපනයන සංවර්ධන පනත යටතේ	73,320	68,076	54,955	සමස්ත කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා පොහොර සහනාධාරය	21,235	62,477	53,782
එකතුව	**75,543**	**70,318**	**57,184**	**එකතුව**	**24,056**	**64,074**	**55,961**

මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව

(අ) *තාවකාලික*

2.6.9 වෙනත් බදු

2.6.9.1 විදුලි සංදේශ බද්ද

2023 වසරේ දී විදුලි සංදේශ සේවාවන්හි අඛණ්ඩව පැවැති වර්ධනය හා 2022 වසර මැද භාගයේ සිදුකරන ලද ගාස්තු ගැලපීම් හි අවශේෂ බලපෑම් හේතුවෙන් විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 15.0 සිට 2023 වසරේ දී රු. බිලියන 17.3 දක්වා සියයට 15.4 කින් වැඩිවිය.

2.6.9.2 අපගමන බද්ද

ආර්ථිකය ස්ථායීතාවයට පත්වීමත් සමඟ සංචාරකයින්ගේ පැමිණීම් සැළකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ සිදු වූ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස අපගමන බද්දේන් ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 22.2 සිට 2023 වසරේ දී රු. බිලියන 38.8 ක් ලෙස සියයට 74.5 කින් වැඩි විය.

2.6.9.3 ඔට්ටු ඇල්ලීම සහ සූදු බද්ද

ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බද්දෙන් එකතු වූ මුළු ආදායම 2022 වසරේ දී රු. බිලියන 5.2 සිට 2023 වසරේ දී රු. බිලියන 7.4 ක් දක්වා සියයට 41.5 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. ශ්‍රී ලංකාවට සංචාරක පැමිණීම් නැවත යථා තත්ත්වයට පත්වීම, ශ්‍රී ලංකාව තුළ සංචාර සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් ඉහළ යාම සහ 2023 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සූදු ක්‍රීඩාව සිදු කෙරෙන ව්‍යාපාරික ස්ථානයන්ට ඇතුළුවන ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා ප්‍රවේශ ගාස්තු අයකිරීම ක්‍රියාවට නැංවීම හා සූදු ක්‍රීඩා කරන ස්ථාන සඳහා වාර්ෂික ගාස්තුවක් පැනවීම වැනි ආදායම් ක්‍රියාමාර්ග ගැනීම මෙයට හේතු විය. මීට අමතරව, ඔට්ටු ඇල්ලීම සහ සූදු ක්‍රීඩා කර්මාන්තය වඩාත් විධිමත් කිරීම සඳහා මාර්ගගත ක්‍රීඩා සඳහා රෙගුලාසි හඳුන්වා දීම සහ බුකීකරු ව්‍යාපාර සහ සූදු ව්‍යාපාර කරගෙන යන පුද්ගලයෙකු විසින් ගෙවිය යුතු වාර්ෂික බද්ද වැඩි කිරීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදි.

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ 2022 වසරේ දී පනවන ලද නමුත්, 2023 වසරේ දී සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන ලද අංක 2295/10 දරණ ගැසට් නිවේදනය අනුව ඉහළ කැසිනෝ ලියාපදිංචි ගාස්තු ප්‍රමාණයක් එකතුකර ගැනීම හේතුවෙන් කැසිනෝ ක්‍රීඩා මගින් ලැබෙන ආදායම ද රු. බිලියන 2 ක අගයක් ගනු ලැබිණි.

2.7 බදු නොවන ආදායම

බදු නොවන ආදායම නාමික වශයෙන්, 2022 වසරේ දී රු. බිලියන 228.1 සිට 2023 වසරේ දී රු. බිලියන 328.3 දක්වා සියයට 43.9 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. මෙමඟින් දඩ, ගාස්තු සහ අය කිරීම් වලින් ආදායම් එකතු කිරීම, 2022 වසරේ දී රු. බිලියන 90.1 සිට 2023 වසරේ දී රු. බිලියන 146.6 දක්වා සියයට 62.8 කින් ඉහළ යාම පිළිබිඹු වේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගාස්තු සහ අය කිරීම් ඉහළ නැංවීම මෙයට හේතු විය. ඒ අනුව, බදු නොවන ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස, 2022 වසරේ දී සියයට 0.9 සිට 2023 වසරේ දී සියයට 1.2 දක්වා වැඩි විය. මේ අතර, පොලී අනුපාත වැඩිවීම හේතුවෙන් පොලී ආදායමෙන් ලද බදු නොවන ආදායම 2022 වසරේ දී රු. බිලියන 7.3 සිට 2023 වසරේ දී රු. බිලියන 26.2 දක්වා සියයට 258.3 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. රජය සතු ව්‍යවසායයන්ගෙන් ලැබූ ලාභ සහ ලාභාංශ ද 2022 වසරේ දී රු. බිලියන 28.1 සිට 2023 වසරේ දී රු. බිලියන 75.7 දක්වා සියයට 169.5 කින් ඉහළ ගියේය. සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලැබෙන ආදායම 2022 වසරේ දී රු. බිලියන 37.4 සිට 2023 වසරේ දී රු. බිලියන 36.3 දක්වා සියයට 3.1 කින් සුළු වශයෙන් අඩු විය. මේ අතර, අනෙකුත් බදු නොවන ආදායම් මාර්ගවලින් ලද ආදායම 2022 වසරේ දී රු. බිලියන 29.3 සිට 2023 වසරේ දී රු. බිලියන 35.5 දක්වා සියයට 21.1 කින් ඉහළ යන ලදි.

වගුව 7: බදු නොවන ආදායම

රු.මිලියන

අයිතමය	2022	2023(අ)	2022/2023 (ප්‍රතිශතක වෙනස)	2023 (සමස්ථ බදු නොවන ආදායමේ % ලෙස)
පොලී/කුලී	13,188	33,231	152.0	10.1
ලාභ සහ ලාභාංශ	28,092	75,701	169.5	23.1
විකුණුම් සහ ගාස්තු	90,050	146,566	62.8	44.6
සමාජ ආරක්ෂණ දායක මුදල්	37,416	36,258	-3.1	11.0
මහ බැංකු ලාභ පැවරීම	30,007	1,029	-96.6	0.3
අනෙකුත්	29,300	35,474	21.1	10.8
එකතුව	**228,052**	**328,259**	**43.9**	**100.0**

මූලාශ්‍ර: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත	
2023.01.01	**පුද්ගල ආදායම් බද්ද**
	වාර්ෂික බදු ආදායම
	මූලික රු. 1,200,000 -නිදහස් රු.500,000-රු. 1,000,000- 6 % රු. 1,000,000-රු. 1,500,000- 12 % රු. 1,500,000-රු. 2,000,000 - 18 % රු. 2,500,000-රු. 3,000,000 - 24 % රු. 3,000,000-රු. 3,500,000 - 30 % රු. 3,500,000 ට වැඩි -36 %
2023.01.01	**රඳවාගැනීමේ බද්ද**
	රඳවාගැනීමේ බදු අනුපාත
	ලාභාංශ - 15% පොලිය හෝ වට්ටම් - 5% මසකට රු.100,000 ඉක්මවන කුලීගෙවීම් - 10% මසකට රු. 100,000 ඉක්මවන සේවා ගෙවීම් - 5% අනෙකුත් සියළු අවස්ථා- 14%
2023 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත	
2023.04.01	- සේවක භාර අරමුදලට, අනුමත අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ අනුමත අවසන් කිරීමේ අරමුදලට 30% දක්වා අදාළ වන ආදායම් බදු අනුපාතය සහ දේශීය ණය ප්‍රශස්ත කිරීමේ ක්‍රියාවලියට ඵලදායී ලෙස සහභාගී වන අරමුදල් සඳහා ආදායම් බදු අනුපාතිකය 14% ලෙස අදාළ වන පරිදි ඉහළ නැංවීම.
ඔට්ටු ඇල්ලීම සහ සූදුබදු- 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදුබදු පනත	
2023.04.01	**2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදුබදු (සංශෝධන) පනත** i. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත යටතේ බලපත්‍රයක් ලබා ගන්නා නව කැසිනෝ ව්‍යාපාර සඳහා, ඔට්ටු ඇල්ලීම හා සූදුබදු පනත යටතේ පනවා ඇති බදු ගෙවීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචිවීම සම්බන්ධයෙන් පවතින සීමාව ඉවත්කිරීමට. ii. පිරිවැටුම මත දළ එකතු කිරීමේ බද්ද 10% සිට 15% දක්වා වැඩිකිරීම. iii. සූදු ව්‍යාපාරික ස්ථානයකට ඇතුළු වන ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගෙන්ම කැසිනෝ ඇතුල්වීමේ බද්ද ඇ.ඩො. 100 (මෙය මේ දක්වා එකතු කර නැත) සිට ඇ.ඩො. 50 දක්වා හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් දක්වා අඩුකිරීම.

	iv. 2023 අප්‍රේල් 01 වැනිදා හෝ ඉන්පසුව ආරම්භවන සෑම වසරක් සඳහාම සුදුව්‍යාපාර පවත්වාගෙනයනු ලබන පුද්ගලයකු විසින් ගෙවියයුතු වාර්ෂික බද්ද රු. මිලියන 200 සිට රු. මිලියන 500 ක් දක්වා වැඩිකිරීම. v. 2023 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ආරම්භවන සෑම වසරක් සඳහාම බුකී ව්‍යාපාරය කරගෙනයන පුද්ගලයෙකු විසින් ගෙවියයුතු වාර්ෂික බද්ද පහත පරිදි වැඩිකිරීම; නියෝජිතයෙකු හරහා රු. මිලියන 4 සිට රු. මිලියන 5 දක්වා සජීවී විකාශන පහසුකම් භාවිතයෙන් රු. 600,000 සිට රු.1,000,000 දක්වා සජීවී විකාශන පහසුකම් භාවිතයෙන් තොරව රු. 50,000 සිට රු.75,000 දක්වා vi. මාර්ගගත ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම සඳහා බුකිකරු සහ සූදුක්‍රීඩා වැනි යෙදුම් නැවත අර්ථ දැක්වීම. vii. දැනට බලාත්මකව පවතින අනෙකුත් පනත් වෙත යොමුකිරීම සඳහා ඔට්ටු ඇල්ලීම හා සූදුබදු පනතේ අදාළ වගන්ති නැවත කෙටුම්පත් කිරීම.
2023 අංක 04 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත	
2023.05.08	I. පුද්ගලික ආදායම් බදු ගෙවන්නන් සඳහා ඉලෙක්ට්‍රොනික බදු ගොනු කිරීම අනිවාර්ය කිරීම. II. ආපසු ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ නේවාසික පුද්ගලයන් විසින් බදු වගකීම ඉක්මවා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම කඩිනම් කිරීම. III. මුදල් ගනුදෙනු අධෛර්යමත් කිරීම. දිනකට සමස්තයක් ලෙස ගෙවීම රු. 500,000/= හෝ ඊට වැඩි , හෝ තනි ගනුදෙනුවකදී හෝ එක් අවස්ථාවකදී බදු අරමුණු සඳහා වියදම් ලෙස අඩු කිරීමට ඉඩ නොදේ. IV. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට (IRD) පුද්ගල මට්ටමින් බදු ගෙවන්නන්ගේ ගනුදෙනු තොරතුරු ඉදිරිපත් කිරීමට මූල්‍ය ආයතන බැඳීයාව. V. ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘතියක නියැලීමෙන් අනේවාසික පුද්ගලයකු විසින් ලබා ගන්නා මුදල් නිදහස් කිරීම.
ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත	
2023.06.01	2023.05.31 දිනැති අංක 2334/21 දරන ගැසට් නිවේදනය - 2022 අතුරු අයවැයේ යෝජනා කර ඇති පරිදි , වාර්ෂික ආදායම සහ බදු නිදහස් සීමාවන් නොසලකා වයස අවුරුදු 18ට වැඩි සියලුම වාසික පුද්ගලයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනිවාර්ය බදු ලියාපදිංචිය හඳුන්වා දීම. - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ දැනටමත් ලියාපදිංචි වී ඇති පුද්ගලයන් හැර, කාණ්ඩ 14ක වෘත්තිකයන් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනිවාර්ය බදු ලියාපදිංචිය හඳුන්වා දීම. - ඉහත සඳහන් කාණ්ඩ වලට ඇතුළත් නොවන, එහෙත් 2023 දෙසැම්බර් 31 වැනි දින වන විට වයස අවුරුදු 18ක් හෝ ඊට වැඩි ඕනෑම පුද්ගලයෙකු 2024 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වන පරිදි දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි විය යුතුය. - 2024 ජනවාරි 01 දින හෝ ඊට පසු වයස අවුරුදු 18 සම්පූර්ණ වන ඕනෑම පුද්ගලයෙකු වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ලියාපදිංචි විය යුතුය.
2024.04.01	2024.03.21 දිනැති අංක 2376/25 දරන ගැසට් නිවේදනය - රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (CGIR) වෙත නිතිපතා ලබාදිය යුතු තොරතුරු නියම කිරීම.
2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත	
2024.01.12	**2024.01.12 දිනැති අංක 2366/33 දරන ගැසට් නිවේදනය** - 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර රෙගුලාසියේ 5 වැනි වගන්තියට ආදේශ කිරීම සහ එහි දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ව්‍යුහයන් සංශෝධනය කරමින් II වන උපලේඛනයක් ඇතුළත් කිරීම.
2024.02.02	**2024.02.02 දිනැති අංක 2369/42 දරන ගැසට් නිවේදනය** - රෙගුලාසියෙහි II උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු හා සම්බන්ධ ආයෝජන නිර්ණායක සංශෝධනය කිරීම.

2024.04.22	**2024.04.22 දිනැති අංක 2381/16 දරන ගැසට් නිවේදනය** - 2024 ජනවාරි 12 දිනැති අංක 2366/33 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සහ 2024 පෙබරවාරි 02 දිනැති අංක 2369/42 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සිංහල පරිවර්තන/ අනුවාදය සංශෝධනය කිරීම.
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත	
2023.09.08	**2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව (සංශෝධන) බදු පනත** 1. පහත අයිතම සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කිරීම සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතෙහි පළමුවන උපලේඛනයේ Iඅ කොටස සංශෝධනය කිරීමට, i. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ හඳුන්වාදුන් නිෂ්පාදන බද්ද, බදු ව්‍යුහය සරල කිරීමට හඳුන්වා දුන් බද්දක් වන බැවින් ආනයනයේදී නිෂ්පාදන බද්දට යටත්වන ඕනෑම මෝටර් රථයක්. ii. විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් මත බදු බර අඩු කිරීම සඳහා එවැනි පුද්ගලයන් භාවිතා කරන උපකරණ. iii. කපා ඔප දැමීමෙන් පසු ප්‍රතිඅපනයනය කිරීමේ ශ්‍රී ලාංකික ව්‍යාපාර වල බදු බර අඩු කිරීමෙන් ගෝලීය වෙළඳපොළ තුළ තරඟකාරීත්වය පවත්වාගෙන යාමට ප්‍රති අපනයනය කිරීම සඳහා ආනයනය කරන රළු ඔපදමා නොමැති මැණික් ගල්. iv. අනෙකුත් ආනයන බදු ඉවත්කර ඇති ලෙසම තීරුබදු රහිත සාප්පු වල විකුණනු ලබන ඕනෑම භාණ්ඩයක්. v. ඉහළ යන ජීවන වියදම අවම කිරීමට දේශීයව නිෂ්පාදනය කරන වී වලින් නිපදවන සහල්. 2. බෙදාහැරීමේ බලපත්‍රයක් යටතේ සිදුකරන විදුලිය සැපයීම හැර, විදුලිය නිපදවීම හා සැපයීම සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කිරීම සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතෙහි පළමු උපලේඛනයේ II කොටසෙහි i අයිතමය සංශෝධනය කිරීම. 3. සිවිල් ගුවන් සේවා පනතේ 97 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ද්‍රව්‍ය ප්‍රවාහන සේවා බලපත්‍රයක් දරනු ලබන සාමාන්‍ය අලෙවි නියෝජිතයන්ගේ අඩු ලාභ මට්ටම් සලකා එවැනි අලෙවි නියෝජිතයන් සපයන සේවා නිදහස් කිරීමට සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතෙහි පළමු උපලේඛනයේ II වන කොටස සංශෝධනය කිරීමට.
2024.01.01	**2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව (සංශෝධන) බදු පනත** - සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි සීමාව වසරකට රුපියල් මිලියන 120 සිට රුපියල් මිලියන 60 දක්වා අඩු කිරීම.
එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත	
2023.01.01	2022 අංක 44 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත - සහාධිපත්‍ය නේවාසික මහල් නිවාස මත එකතු කළ අගය මත බදු නිදහස් කිරීම ඉවත් කිරීම.
2024.01.01	2023.12.19 දිනැති අංක 2363/22 දරන ගැසට් නිවේදනය - වැට් බදු අනුපාතය සියයට 15 සිට සියයට 18% ක් දක්වා වැඩි කිරීම.

2024.01.01	2023 අංක 32 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත - ප්‍රධාන අයිතම සඳහා අදාළ වන වැට් බදු නිදහස් කිරීම්වලින් අතිමහත් බහුතරයක් ඉවත් කිරීම.
2024.01.01	2024 අංක 16 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත - එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි සීමාව වසරකට රුපියල් මිලියන 80 සිට වසරකට රුපියල් මිලියන 60ක් දක්වා අඩු කිරීම.
නිෂ්පාදන බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු විශේෂ (විධිවිධාන) පනත	
2023.01.01	2022.12.31 දිනැති අංක 2312/68 දරන ගැසට් නිවේදනය - ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත/ ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන නිෂ්පාදන බදු නියම කිරීම. - ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා අදාළ වන නිෂ්පාදන බද්ද වැඩි කිරීමට. - දුම්වැටි සඳහා අදාළ වන නිෂ්පාදන බද්ද වැඩි කිරීමට.
2023.06.01	2023.05.31 දිනැති අංක 2334/23 දරන ගැසට් නිවේදනය - ඉන්ධන (පෙට්‍රල් සහ ඩීසල්) මත වන නිෂ්පාදන බදු අනුපාතය ලීටරයකට රු. 25 කින් වැඩි කිරීම.
2023.06.17	2023.06.16 දිනැති අංක 2336/69 දරන ගැසට් නිවේදනය - පැල්මිටික් අම්ලය (HS කේත 2915.70.10) සහ ලෝරික් අම්ලය(HS කේත 2915.90.10) සඳහා CIF අගයෙන් 29%ක නිෂ්පාදන බදු අනුපාතයක් පැනවීම.
2023.07.01	2023.06.30 දිනැති අංක 2338/58 දරන ගැසට් නිවේදනය - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම් වැඩසටහනට අනුකූලව සියලුම දුම්වැටි වර්ග සඳහා නිෂ්පාදන බද්ද සියයට 20 කින් වැඩි කිරීම.
2024.01.01	2023.12.31 දිනැති අංක 2364/36 දරන ගැසට් නිවේදනය - සුවිගත කිරීමක් මත ඒකක අනුපාත සහිත බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල නිෂ්පාදන බද්ද 14% කින් සංශෝධනය කිරීම සහ පෙට්‍රල් ලීටරයක නිෂ්පාදන බද්ද රුපියල් 5 කින් සහ ඩීසල් ලීටරයක නිෂ්පාදන බද්ද රුපියල් 6 කින් අඩු කිරීම.
සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)	
2023.01.03	සුරාබදු නිවේදන අංක 07/2022(2022.12.31 දිනැති අංක 2312/70 දරන ගැසට් නිවේදනය) - මත්පැන් මත සුරා බද්ද වැඩිකිරීම.
2023.06.17	සුරාබදු නිවේදන අංක 01/2023 (2023.06.16 දිනැති අංක 2336/70 දරන ගැසට් නිවේදනය) - බලපත්‍ර සහිතව හෝ රහිතව සන්තකයේ තබාගත හැකි අයිසො ප්‍රොපයිල් (Isopropyl) මධ්‍යසාරවල වර්තමාන සීමාවන් වැඩි කිරීම.
2023.07.01	සුරාබදු නිවේදන අංක 02/2023 (2023.06.30 දිනැති අංක 2338/57 දරන ගැසට් නිවේදනය) - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම් වැඩසටහනට අනුකූලව සියලුම මත්පැන් වර්ග සඳහා සුරා බද්ද සියයට 20කින් වැඩි කිරීම.
2023.12.09	සුරාබදු නිවේදන අංක 03/2023 (2023.12.08 දිනැති අංක 2361/44 දරන ගැසට් නිවේදනය) - සුරාබදු බලපත්‍ර සඳහා පරීක්ෂා කිරීම් බලාත්මක කිරීමේ අවසන් වේලාවන් හා ආශ්‍රිතව ඉහළ යන පිරිවැය අවම කිරීමේ අරමුණ ඇතිව සියලු වර්ගවල සුරාබදු බලපත්‍ර සඳහා එක් විවෘත කිරීමේ වේලාවක් සහ එක් වසා තැබීමේ වේලාවක් පවත්වා ගැනීම.
2024.01.01	සුරාබදු නිවේදන අංක 04/2023 (2023.12.31 දිනැති අංක 2364/35 දරන ගැසට් නිවේදනය) - සුරාබදු සඳහා වාර්ෂික උද්ධමන ගැලපීමක් හඳුන්වාදීමේ අරමුණ ඇතිව සියලු වර්ගවල මත්පැන් සඳහා සුරා බද්ද සියයට 14 කින් වැඩි කිරීම.
2024.01.12	සුරාබදු නිවේදන අංක 01/2024 (2024.01.12 දිනැති අංක 2366/38 දරන ගැසට් නිවේදනය) - වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම.

2024.01.12	සුරාබදු නිවේදන අංක 02/2024 (2024.01.12 දිනැති අංක 2366/39 දරන ගැසට් නිවේදනය) - සුරාබදු නිවේදන අංක 902 හි විධිවිධාන සංශෝධනය කිරීම.
2024.02.01	සුරාබදු නිවේදන අංක 03/2024 (2024.02.01 දිනැති අංක 2369/32 දරන ගැසට් නිවේදනය) - වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු ගාස්තු හඳුන්වා දීම.
දුම්කොළ බදු - 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත	
2023.01.01	2022.12.31 දිනැති අංක 2312/71 දරන ගැසට් නිවේදනය - බීඩියක් මත රුපියල් දෙකක බද්දක් පැනවීම.
රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය)	
2023.01.05	2023.01.04 දිනැති අංක 2313/35 දරන ගැසට් නිවේදනය - 2017 රේගු සංයෝජිත සංකේතාංක අඩංගුව දැනට පවතින නියෝගය 2022 හි නව රේගු සංයෝජිත සංකේතාංක සංකේත අනුව නැවත නිකුත් කිරීම.
2023.06.01	2023.05.31 දිනැති අංක 2334/28 දරන ගැසට් නිවේදනය - 2023 දෙසැම්බර් 31 දක්වා තවත් මාස හයක කාලයක් සඳහා තෝරාගත් භාණ්ඩ සඳහා රේගු ආනයන බද්දේ ප්‍රතිශතයක් ලෙස අධිභාරය දිගටම පවත්වාගෙන යෑම සඳහා 2022.11.30 දිනැති අංක 2308/16 දරන ගැසට් නිවේදනය නැවත නිකුත් කිරීම.
වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද - 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත	
2023.01.01	2022.12.31 දිනැති අංක 2312/67 දරන ගැසට් නිවේදනය - ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද නියම කිරීම.
2023.04.04	2023.04.03 දිනැති අංක 2326/02 දරන ගැසට් නිවේදනය - අයවැය 2023 හි යෝජනාවට අනුව වසර පහක් තුල වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීමේ පළමු පියවර ලෙස 1631 තීරුබදු අයිතම මත අදාළ වන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද නිදහස් කිරීම.
2023.09.22	2023.09.21 දිනැති අංක 2350/45 දරන ගැසට් නිවේදනය - 2021 අගෝස්තු මාසයේ සිට කිරිපිටි ආනයනය සඳහා නිදහස් කරන ලද වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද 10% ක් පැනවීම.
2024.01.01	2023.12.31 දිනැති අංක 2364/37 දරන ගැසට් නිවේදනය - 2023 වසරේ අයවැය යෝජනා අංක 34.6 අනුව වසර පහක් ඇතුලත වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු බැවින් පෙට්‍රල්, ඩීසල් සහ පොහොර ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය 26 ක වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද (PAL) ඉවත් කිරීම.
2024.03.29	2024.03.28 දිනැති අංක 2377/39 දරන ගැසට් නිවේදනය - ශ්‍රී ලංකා- සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ(SLSFTA) විධිවිධාන අනුව, භාණ්ඩ 3,117ක් සඳහා සහනදායී මිල ගණන් යෙදීමට සහ සිංගප්පූරුවෙන් එම භාණ්ඩ ආනයනය කිරීමේදී භාණ්ඩ 595ක් නිදහස් කිරීම.
සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත	
2023.01.01	2023.01.01 දිනැති අංක 2312/76 දරන ගැසට් නිවේදනය - ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන සෙස් බද්ද නියම කිරීම.

2023.03.29	2023.03.28 දිනැති අංක 2325/06 දරන ගැසට් නිවේදනය - 2023 අයවැයෙන් යෝජනා කර ඇති පරිදි වසර තුනක් ඇතුළත සෙස් බද්ද ඉවත් කිරීමේ පළමු පියවර ලෙස සංයෝජිත සංකේතාංක කේත 8155 කින් සංයෝජිත සංකේතාංක කේත 2668 ක සෙස් බද්ද අඩු කිරීම.
2023.06.17	2023.06.16 දිනැති අංක 2336/71 දරන ගැසට් නිවේදනය - පෝට්ලන්ඩ් සිමෙන්ති ආනයනය මත සෙස් බද්ද වැඩි කිරීම සහ ක්ලින්කර් ආනයනය මත කිලෝග්‍රෑමයකට රු. 1/- ක සෙස් බද්දක් පැනවීම.
2023.07.22	2023.07.21 දිනැති අංක 2341/63 දරන ගැසට් නිවේදනය - තීරුබදු විෂමතා ඉවත් කිරීම සඳහා දේශීය මුද්‍රණ තීන්ත නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී සෙස් බදු සහන ලබා දීම.
2024.01.06	2024.01.04 දිනැති අංක 2365/50 දරන ගැසට් නිවේදනය - ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) යටතේ සෙස් බද්දට අදාළ තීරුබදු ලිබරල්කරණ වැඩසටහන (TLP) ප්‍රකාශයට පත් කිරීම.
සෙස් බද්ද - 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත	
2023.01.31	2023.01.26 දිනැති අංක 2316/32 දරන ගැසට් නිවේදනය - කොළඹ කොටස් වෙළඳපොල හරහා ආයතනික ණය සුරැකුම්පත් වල නැවත මිලදී ගැනීමේ ගණුදෙනු සඳහා 0.006 %ක සෙස් බද්දක් පැනවීම.
බදු නොවන (ගාස්තු සහ අය කිරීම්)- 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත	
2024.02.01	2024.01.12 දිනැති අංක 2366/34 දරන ගැසට් නිවේදනය - වෙළඳපල අතරමැදියන් සහ වෙළඳපල ආයතන සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අය කරනු ලබන ගාස්තු සහ අය කිරීම් සංශෝධනය කිරීම.
රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත	
2023.01.01	ආදායම් සංරක්ෂණ ආඥා අංක 07/2022 (2023.01.01 දිනැති අංක 2312/75 දරන ගැසට් නිවේදනය) - ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රවාහයන්ට පහසුකම් සැලසීම සඳහා සෑම වසර 05කට වරක්ම රේගු සංයෝජිත සංකේතාංක යාවත්කාලීන කිරීම.ශ්‍රී ලංකාවේ ඉලක්කම් අටකින් යුතු රේගු සංකේතාංක 7,842 ක් ඇත. කෙසේ වුවත්, 2022 සංස්කරණය මගින් එම රේගු සංකේතාංක සංඛ්‍යාව 8,155 ක් දක්වා වැඩි වී ඇත.
2023.03.29	ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2023 (2023.03.28 දිනැති අංක 2325/07 දරන ගැසට් නිවේදනය) - 0%, 10% සහ 15% සිට 0%, 15%, 20% දක්වා රේගු ආනයන බදු අනුපාත සංශෝධනය කිරීම මගින් සෙස් බද්ද සියයට 20 කින් අඩු කිරීම සලකා ආදායම් මධ්‍යස්ථභාවය පවත්වා ගැනීම සඳහා නිශ්චිත අයිතම සඳහා රේගු ආනයන බදු අනුපාතය වැඩි කිරීම.
2023.06.17	ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2023 (2023.06.16 දිනැති අංක 2336/72 දරන ගැසට් නිවේදනය) - දේශීය රූපලාවණ්‍ය කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා පාම් ඔයිල් මේද අම්ලයේ තීරුබදු ව්‍යුහයට සමාන තීරුබදු ව්‍යුහයක් පැනවීම සහ පැල්මිටික් අම්ලය සහ ලෝරික් අම්ලය සඳහා නව සංයෝජිත සංකේතාංක කේතයන් (ජාතික උපබෙදුම්) නිර්මාණය කිරීම.
2023.07.01	ආදායම් සංරක්ෂණ ආඥා අංක 03/2023 (2023.06.30 දිනැති අංක 2338/54 දරන ගැසට් නිවේදනය) - ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු 1,238 ක රේගු ආනයන තීරුබදු ලිබරල්කරණ වැඩසටහනේ (TLP) "6" කාණ්ඩය යටතේ වාර්ෂික වාරික හයෙන් පළමු වාරිකය ඉවත් කිරීම.
2023.07.22	ආදායම් සංරක්ෂණ ආඥා අංක 04/2023 (2023.07.21 දිනැති අංක 2341/64 දරන ගැසට් නිවේදනය) - තීරුබදු විෂමතා ඉවත් කිරීම සඳහා දේශීය මුද්‍රණ තීන්ත නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී රේගු ආනයන බදු සියයට 5ක සහනදායී අනුපාතයක් හඳුන්වා දීම.
2023.08.30	ආදායම් සංරක්ෂණ ආඥා අංක 05/2023 (2023.08.29 දිනැති අංක 2347/06 දරන ගැසට් නිවේදනය) - තිරිඟු පිටි ආනයනය සඳහා ආනයන බද්ද සියයට 15කින් හෝ කි.ග්‍රෑ. රු. 16 සිට සියයට 20 හෝ කි.ග්‍රෑ. රු. 27 දක්වා වැඩි කිරීම.

2024.01.06	ආදායම් සංරක්ෂණ ආඥා අංක 06/2023 (2024.01.04 දිනැති අංක 2365/51 දරන ගැසට් නිවේදනය) - ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු 1,222 ක රේගු ආනයන තීරුබදු ලිබරල්කරණ වැඩසටහනේ (TLP) "6" කාණ්ඩය යටතේ වාර්ෂික වාරික හයෙන් දෙවන වාරිකය ඉවත් කිරීම.
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත	
2023.01.05	2023.01.04 දිනැති අංක 2313/34 දරන ගැසට් නිවේදනය - 2017 රේගු සංයෝජිත සංකේතාංක අඩංගුව දැනට පවතින නියෝගය 2022 හි නව රේගු සංයෝජිත සංකේතාංක සංකේත අනුව නැවත නිකුත් කිරීම.
2023.01.26	2023.01.25 දිනැති අංක 2316/28 දරන ගැසට් නිවේදනය - දේශීය සත්ව ආහාර නිෂ්පාදන කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය ඇතිව 2023 ජනවාරි 15 හෝ ඊට පෙර ශ්‍රී ලංකාවේ වරාය/ගුවන්තොටුපලවල බඩඉරිඟු තොග ගෙනඒමට යටත්ව සහනය දීර්ඝ කිරීම.
2023.02.21	2023.02.20 දිනැති අංක 2320/04 දරන ගැසට් නිවේදනය - බිත්තර ආනයනයේදී බිත්තරයකට රුපියල් 50/-ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හඳුන්වා දීම සහ බේකරි කර්මාන්තය සඳහා සාධාරණ මිලකට බිත්තර ලබා දීමට රාජ්‍ය වාණිජ සංස්ථාව සඳහා බිත්තරයකට රු. 1/- ක සහන මිලක් ලබා දීම.
2023.03.04	2022.03.04 දිනැති අංක 2321/76 දරන ගැසට් නිවේදනය - දේශීය ගොවීන් සඳහා වඩා හොඳ මිලක් සහතික කිරීම පිණිස උඳු, කව්පි, කුරක්කන් සහ අනෙකුත් මෙනේරි සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තවත් වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම.
2023.03.08	2023.03.07 දිනැති අංක 2322/20 දරන ගැසට් නිවේදනය - දේශීය ගොවීන්ගේ අස්වැන්න සඳහා සාධාරණ වෙළඳපල මිලක් සහතික කිරීම මගින් ඔවුන් දිරිමත් කිරීම පිණිස අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු.50/- ක් දක්වා වැඩි කිරීම.
2023.03.08	2023.03.07 දිනැති අංක 2322/21 දරන ගැසට් නිවේදනය - රාමසාන් උත්සව සමය නිමිත්තෙන් කිසිදු විදේශ විනිමය පදනමක් නොමැතිව පරිත්‍යාග හෝ තෑගි වශයෙන් ලැබෙන රට ඉඳි ආනයනය කිරීම සඳහා පමණක් කිලෝවකට රුපියලක සහනයක් සැලසීම.
2023.03.18	2023.03.17 දිනැති අංක 2323/40 දරන ගැසට් නිවේදනය - වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ශීත කළ සම්පූර්ණ බිත්තර දියර ආනයනය කිරීම සඳහා කිලෝවකට රු.200/ ක සහනදායී මිලක් අය කිරීම.
2023.05.18	2023.05.17 දිනැති අංක 2332/14 දරන ගැසට් නිවේදනය - ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු ආනයනය මත කිලෝවකට රු. 50/-ක බදු සහනයක් සැලසීම, බඩ ඉරිඟු ආනයනය මත කිලෝවකට රු.75/-ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම, සහල් ආනයනය මත කිලෝවකට ශත 25 ක සිට රුපියල් 65 දක්වා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වැඩි කිරීම සහ වලංගු කාලය දීර්ඝ කිරීම සහ අනෙකුත් භාණ්ඩ 34ක වලංගු කාලය එම තීරු බදු අනුපාතය ලෙස දීර්ඝ කිරීම.
2023.05.21	2023.05.20 දිනැති අංක 2332/53 දරන ගැසට් නිවේදනය - බේකරි කර්මාන්තය සඳහා සාධාරණ මිලකට බිත්තර ලබා දීමට රාජ්‍ය වාණිජ සංස්ථාව සඳහා බිත්තරයකට රු. 1/-ක සහනදායී මිලක් ලබා දීම සහ බිත්තර ආනයනය කිරීමේදී බිත්තරයකට රු.50/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම.
2023.06.23	2023.06.22 දිනැති අංක 2337/16 දරන ගැසට් නිවේදනය - ආහාර ප්‍රතිපත්ති කමිටුවේ තීරණය සලකා බලා, වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ශීත කළ සම්පූර්ණ බිත්තර දියර ආනයනය කිරීම සඳහා කිලෝවකට රු.200/- ක සහනදායී මිලක් අය කිරීම.
2023.07.14	2023.07.13 දිනැති අංක 2340/45 දරන ගැසට් නිවේදනය

	- ආනයනික මිල සහ ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා ටෙන්ඩර් මිලෙහි වෙනස සලකා බඩඉරිඟු ආනයනයේදී ලබා දී ඇති සහන ඉවත් කිරීම සහ සාමාන්‍ය තීරු බදු ව්‍යුහය පැනවීම.
2023.08.01	2023.07.31 දිනැති අංක 2343/11 දරන ගැසට් නිවේදනය - භාණ්ඩ 6ක් සඳහා වලංගු කාලය දීර්ඝ කිරීම සහ ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලුණු ආනයනය මත තීරුබදු නිදහස් කිරීම හා සෙයිල් මාළු, මාර්ලින් මාළු සහ ක්වීන් මාළු වැනි මත්ස්‍ය ප්‍රභේද ආනයනය කිරීමේදී තීරු බදු සහනයට යටත් වන HS කේතයන් සංශෝධනය කිරීම.
2023.08.18	2023.08.17 දිනැති අංක 2345/64 දරන ගැසට් නිවේදනය - බඩඉරිඟු ආනයනය සඳහා රුපියල් 25 ක සහනදායී විශේෂ වෙළඳ භාණ්ඩ තීරුබදු අනුපාතයක් හඳුන්වා දීම සහ කළු ඇට සහ මුං ආනයනය සඳහා තීරු බදු අනුපාතය සංශෝධනය කිරීම.
2023.08.21	2023.08.21 දිනැති අංක 2346/16 දරන ගැසට් නිවේදනය - බිත්තර ආනයනය කිරීමේදී බිත්තරයකට රු.50/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම සහ රාජ්‍ය වාණිජ සංස්ථාව සඳහා බිත්තරයකට රු. 1/-ක සහනදායී මිලක් ලබා දීම.
2023.09.08	2023.09.08 දිනැති අංක 2348/44 දරන ගැසට් නිවේදනය - කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම.
2023.10.14	2023.10.14 දිනැති අංක 2353/77 දරන ගැසට් නිවේදනය - මාළු, උම්බලකඩ, පරිප්පු, මැන්ගුස් සහ කිවි පලතුරු ආනයනය සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය වසරක කාලයක් සඳහා දීර්ඝ කිරීම සහ දේශීය ටින් මාළු කර්මාන්තයේ භාවිතය සඳහා මැකරල් මාළු ආනයනය සඳහා තීරු බදු සහනය දීර්ඝ කිරීම.
2023.11.02	2023.11.01 දිනැති අංක 2356/20 දරන ගැසට් නිවේදනය - සීනි සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට ශත 25 සිට කිලෝ ග්‍රෑමයකට රු. 50 දක්වා වැඩි කිරීම.
2023.12.01	2023.11.30 දිනැති අංක 2360/52 දරන ගැසට් නිවේදනය - භාණ්ඩ 9ක් ආනයනය සඳහා වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා අඛණ්ඩව පවත්වාගෙන යාම සහ 2024 දෙසැම්බර් 31 දක්වා ටින් මාළු ආනයනය සඳහා රු.200/- සහ බී ළූණු ආනයනය සඳහා රුපියල් 10/- ක සහනදායී බදු අනුපාතයක් පවත්වාගෙන යාම.
2024.01.02	2024.01.02 දිනැති අංක 2365/04 දරන ගැසට් නිවේදනය - 2024 ජනවාරි මස 02 වැනි දින සිට 21 වැනි දින දක්වා බලපැවැත්වෙන පරිදි සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/-ක බදු සහනයක් සැලසීම.
2024.01.08	2024.01.07 දිනැති අංක 2365/84 දරන ගැසට් නිවේදනය - 2024 දෙසැම්බර් මස 31 දින දක්වා අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම.
2024.02.20	2024.02.19 දිනැති අංක 2372/06 දරන ගැසට් නිවේදනය - බඩඉරිඟු, උඳු සහ මුං ඇට ආනයනය මත පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීමටත්, එහිදී කව්පි සහ කුරක්කන් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු.70/- සිට රු. 300/- දක්වා වැඩි කිරීම.
2024.03.02	2024.03.01 දිනැති අංක 2373/42 දරන ගැසට් නිවේදනය - 2024 අප්‍රේල් මස 11 දින දක්වා රාමසාන් උත්සව සමය පිළිබඳ සලකා රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැලසීම.
2024.03.27	2024.03.26 දිනැති අංක 2377/17 දරන ගැසට් නිවේදනය - උත්සව සමය පිළිබඳ සලකා බී ළූණු ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 10/-ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ සහනදායී බදු අනුපාතයක් අය කිරීම සහ 2024.01.02 සිට 2024.01.21 දක්වා සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/-ක බදු සහනයක් සැලසීම.
ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත	

2023.01.01	2023 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.01.01 දිනැති අංක 2312/77 දරන ගැසට් නිවේදනය) - ආනයන පාලන බලපත්‍ර ඒකාබද්ධ කිරීම.
2023.01.01	2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.01.01 දිනැති අංක 2312/78 දරන ගැසට් නිවේදනය) - තාවකාලික අත්හිටුවීම ඒකාබද්ධ කිරීම.
2023.01.19	2023 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.01.19 දිනැති අංක 2315/46 දරන ගැසට් නිවේදනය) - ගෙවීම් නියමයන් පිළිබඳ රෙගුලාසි සංශෝධනය කිරීම.
2023.02.22	2023 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.02.22 දිනැති අංක 2320/46 දරන ගැසට් නිවේදනය) - ගෙවීම් නියමයන් පිළිබඳ රෙගුලාසි සංශෝධනය කිරීම.
2023.02.22	2023 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.02.22 දිනැති අංක 2320/47 දරන ගැසට් නිවේදනය - ආනයන සහ අපනයන පාලන රෙගුලාසි සංශෝධනය කිරීම.
2023.03.24	2023 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.03.24 දිනැති අංක 2324/45 දරන ගැසට් නිවේදනය) - පිටාර විමෝචනය සහ ආරක්ෂක පියවරයන්/ සම්මත රෙගුලාසි සංශෝධනය කිරීම.
2023.04.06	2023 අංක 07 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.04.06 දිනැති අංක 2326/40 දරන ගැසට් නිවේදනය) - ගෙවීම් නියමයන් මත ආනයන අපනයන පාලන රෙගුලාසි සංශෝධනය කිරීම.
2023.06.01	2023 අංක 08 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.04.06 දිනැති අංක 2326/41 දරන ගැසට් නිවේදනය) - තනි භාවිත ප්ලාස්ටික් ද්‍රව්‍ය සඳහා රෙගුලාසි පැනවීම.
2023.06.10	2023 අංක 09 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.06.09 දිනැති අංක 2335/26 දරන ගැසට් නිවේදනය) - උපලේඛනයේ විස්තර කර ඇති පරිදි HS කේතයන් යටතේ වර්ගීකරණය කර ඇති භාණ්ඩල 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසිවල I උපලේඛනයෙන් මකා දැමීම.
2023.06.14	2023 අංක 10 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.06.14 දිනැති අංක 2336/45 දරන ගැසට් නිවේදනය) - තිරිඟු හෝ මෙස්ලින් පිටි මත ආනයන පාලන බලපත්‍රය ඇතුළත් කිරීම.
2023.07.02	2023 අංක 11 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.07.02 දිනැති අංක 2341/38 දරන ගැසට් නිවේදනය) - උපලේඛනයේ විස්තර කර ඇති පරිදි HS කේතයන් යටතේ වර්ගීකරණය කර ඇති භාණ්ඩ, 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසිවල I උපලේඛනයෙන් මකා දැමීම.
2023.08.14	2023 අංක 12 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.08.14 දිනැති අංක 2345/03 දරන ගැසට් නිවේදනය) - මගීන්, භාණ්ඩ සහ විශේෂ කාර්ය මෝටර් රථ ප්‍රවාහනය සඳහා භාවිතා කරන මෝටර් රථ සඳහා තාවකාලික අත්හිටුවීම තහවුරු කිරීම. (2023.08.14 දින සිට මාසයක කාලයක් සඳහා වලංගු වේ.)
2023.08.29	2023 අංක 13 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.08.29 දිනැති අංක 2347/08 දරන ගැසට් නිවේදනය) - 2023.06.14 දින අංක 2336/45 දරන ගැසට් නිවේදනය මගින් පනවා තිබූ තිරිඟු පිටි බලපත්‍ර අවශ්‍යතාවය ඉවත් කිරීම.

2023.10.09	2023 අංක 14 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2023.10.09 දිනැති අංක 2353/16 දරන ගැසට් නිවේදනය) - උපලේඛනයේ විස්තර කර ඇති පරිදි HS කේතයන් යටතේ වර්ගීකරණය කර ඇති භාණ්ඩ, 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසිවල I උපලේඛනයෙන් මකා දැමීම.
2024.01.11	2024 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.01.11 දිනැති අංක 2366/19 දරන ගැසට් නිවේදනය) - රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලිකව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ ආනයනය සඳහා ඉඩ සැලසීම.
2024.02.07	2024 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.07 දිනැති අංක 2370/15 දරන ගැසට් නිවේදනය) - 2023 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිකුත් කරන ලද අංක 12(අ) රෙගුලාසිය (අංක 2312/78 දරන ගැසට් නිවේදනයෙහි පළ කරන ලද) සංශෝධනය කරමින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විදුලි මෝටර් වාහන ආනයනය කිරීම සඳහා ලබා දෙන කාලය දීර්ඝ කිරීම.
2024.02.19	2024 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.19 දිනැති අංක 2372/04 දරන ගැසට් නිවේදනය) - අනුමත කරන ලද ව්‍යවසායයක විසින් සකස් කිරීම සහ ප්‍රතිඅපනයන කිරීමේ අරමුණ සඳහා තෝරාගත් කුළුබඩු (උදා:- ගම්මිරිස්, සාදික්කා සහ වසාවාසි) ආනයනයට ඉඩ සැලසීම.
2024.02.29	2024 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.28 දිනැති අංක 2373/28 දරන ගැසට් නිවේදනය) - ගෙවීම මත ලේඛන (DP) සහ පිළිගැනීම මත ලේඛන (DA) යන ගෙවීම් ක්‍රම යටතේ ආනයනයට පූර්ව අනුමැතියක් ලබා ගැනීමේ අවශ්‍යතාවය ඉවත් කරමින්, ආනයන සහ අපනයන (පාලන) අංක 6 රෙගුලාසිය ඉවත් කිරීම.
2024.03.19	2024 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.03.19 දිනැති අංක 2376/14 දරන ගැසට් නිවේදනය) - රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලිකව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ ආනයනය සඳහා ඉඩ සැලසීම.
2024.04.08	2024 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.04.08 දිනැති අංක 2379/03 දරන ගැසට් නිවේදනය) - රෙගුලාසිවල V වන උපලේඛනයේ ලැයිස්තුගත කර වර්ගීකරණය කර ඇති මුළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,000ක් සඳහා පමණක් වූ උඳු ආනයනය කිරීමට ආනයන බලපත්‍ර රෙගුලාසි පැනවීම.
අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත	
2023.01.12	2023.01.11 දිනැති අංක 2314/16 දරන ගැසට් නිවේදනය - අපගමන බද්ද පනවන ලද 2003 වසරේ සිට මෙතෙක් නැව් මගින් පිටත්වන මගීන්ගෙන් අපගමන බද්ද අය කිරීමට නියමයන් පනවා නැත. එබැවින්, ගුවන් යානයකින් මෙන්ම නැවකින් ද ශ්‍රී ලංකාවෙන් පිටත්වන මගීන් සඳහා අපගමන බද්ද අයකිරීමට රෙගුලාසි හඳුන්වා දී ඇත.
2023.04.25	2023.04.25 දිනැති අංක 2329/19 දරන ගැසට් නිවේදනය - කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ, රත්මලාන වෙතින් නියමිත ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කරන ගුවන් සමාගම් අදාළ අපගමන බද්ද සඳහා වන ඇ.එ.ජ. ඩොලර් 60 න් 50% ක් ගෙවීමෙන් ඉවත් කිරීම (එනම් ඇමරිකානු ඩොලර් 30 දක්වා අඩු කිරීමට) 2023 අප්‍රේල් මස 25 දින සිට 2023 මාර්තු මස 26 දක්වා තවත් වසරක කාලයක් දීර්ඝ කිරීම.
2023.07.25	2023.07.25 දිනැති අංක 2342/24 දරන ගැසට් නිවේදනය - යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙතින් ආරම්භ කරන ගුවන් ගමන් මෙහෙයුම් සඳහා අදාළ අපගමන බද්ද වන ඇ.එ.ජ. ඩොලර් 60 න් 50% ක් ගෙවීමෙන් ඉවත් කිරීම (2023 ජූලි මස 25 දින සිට තවත් මාස හයක කාලයක් දක්වා දීර්ඝ කිරීම.

2024.02.01	2024.02.01 දිනැති අංක 2369/27 දරන ගැසට් නිවේදනය - කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළින් ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කර ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා අදාළ වන අපගමන බද්ද වන ඇ.එ.ජ. ඩොලර් 60 න් ඇ.එ.ජ. ඩොලර් 30 ක සහනදායී අනුපාතයක් සඳහා වසරක කාලයක් දක්වා දීර්ඝ කිරීම.
2024.03.07	2024.03.06 දිනැති අංක 2374/19 දරන ගැසට් නිවේදනය - 2024 මාර්තු මස 07 දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි වසර තුනක පමණ කාලයක් සඳහා ඇ.එ.ජ. ඩොලර් 60/- ක බද්ද වෙනුවට, මගී යාත්‍රා ප්‍රවාහනය මගින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.එ.ජ. ඩොලර් 5/- ක සහනදායී අනුපාතයක් සහ මගී නෞකාවක් මගින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.එ.ජ. ඩොලර් 20/- ක සහනදායී අනුපාතයක් ප්‍රදානය කිරීම.
ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද - 2004 අංක 11 දරන මුදල් පනත	
2023.01.01	2023.01.01 දිනැති අංක 2312/80 දරන ගැසට් නිවේදනය - පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, විශේෂිත දුරකථන අංක(STN) මත පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, දේශීය ප්‍රවේශ ගාස්තු (ILAC) , විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC)සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC) සඳහා ගෙවිය යුතු බදු අනුපාතය 2023 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා තවත් වසර දෙකක් සඳහා දීර්ඝ කිරීම.
මෝටර්රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත	
2023.01.01	2022.12.31 දිනැති අංක 2312/69 දරන ගැසට් නිවේදනය - ශ්‍රී ලංකා රේගුව විසින් ක්‍රියාත්මක කරන ලද 2022 සංයෝජිත වර්ගීකරණ සංකේත සංශෝධන අනුවාදයට අනුව , හඳුන්වාදෙන ලද නව සංයෝජිත වර්ගීකරණ සංකේත / ජාතික උපබෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේත සහ සංශෝධිත සංයෝජිත වර්ගීකරණ සංකේත සඳහා අදාළ වන සුඛෝපභෝගී බද්ද නියම කිරීම.
2023.02.10	2023.02.10 දිනැති අංක 2318/53 දරන ගැසට් නිවේදනය - සංක්‍රමණික සේවකයන් ආනයනය කරනු ලබන පූර්ණ විදුලි මෝටර් රථ සඳහා බදු රහිත සීමාව රු. මිලියන 6 සිට මිලියන 12 ක් දක්වා ඉහල නැංවීම.
2023.05.31	2023.05.31 දිනැති අංක 2334/24 දරන ගැසට් නිවේදනය - 2023.02.10 දිනැති අංක 2318/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රේෂණය කිරීම, ණයවර ලිපි (LC) පිහිටුවීම සහ මෝටර් වාහන ලියාපදිංචි කිරීම සලකා බැලීමේ කාලය දීර්ඝ කිරීම. (සංක්‍රමණික සේවකයින් සඳහා පූර්ණ විදුලි මෝටර් රථ වල බදු රහිත සීමාව රුපියල් මිලියන 6 සිට රුපියල් මිලියන 12 දක්වා වැඩි කිරීම.)
2023.07.13	2023.07.13 දිනැති අංක 2340/42 දරන ගැසට් නිවේදනය - රාජ්‍ය තාන්ත්‍රිකයන් හෝ රාජ්‍යතාන්ත්‍රික සංවිධාන විසින් 100% තීරුබදු රහිත පදනම මත ආනයනය කරන ලද වාහන සඳහා භාවිත කළ වර්ෂ අනුව බැහැර කිරීමේ යාන්ත්‍රණය තීරණය කිරීම.
2024.01.24	2024.01.24 දිනැති අංක 2368/24 දරන ගැසට් නිවේදනය - 2023.02.10 දිනැති අංක 2318/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රේෂණය කිරීම, ණයවර ලිපි (LC) පිහිටුවීම සහ මෝටර් වාහන ලියාපදිංචි කිරීම සලකා බැලීමේ කාලය තව දුරටත් දීර්ඝ කිරීම. (සංක්‍රමණික සේවකයින් සඳහා පූර්ණ විදුලි මෝටර් රථ වල බදු රහිත සීමාව රුපියල් මිලියන 6 සිට රුපියල් මිලියන 12 දක්වා වැඩි කිරීම.)

අභියෝග හා අනාගත ඉලක්ක

1. අඛණ්ඩ ආර්ථික ප්‍රකෘතිය සඳහා සහය දැක්වීම සඳහා පවතින සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මාවත අඛණ්ඩව පවත්වාගෙන යාම සහ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සමෘද්ධිය ලබා දෙන සහ යහපැවැත්ම වැඩි කරන සියල්ල ඇතුළත්, තිරසාර සහ ශක්තිමත් වර්ධන මාවතක් ස්ථාපිත කිරීම.

2. තිරසාර සහ ඇතුළත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම සඳහා බදු ප්‍රතිපත්ති, බදු පරිපාලනය සහ නීති සම්පාදනය ආවරණය වන පරිදි ඵලදායී මූල්‍ය ප්‍රතිසංස්කරණ සකස් කිරීම.

3. 2025 වසරේ දී සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ලබා ගැනීම සහ එය මධ්‍ය කාලීනව පවත්වා ගෙන යාම සඳහා රාජ්‍ය ණය තිරසාර මට්ටමක පවත්වා ගැනීම.

4. බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ ප්‍රධාන ආදායම් එකතු කිරීමේ ආයතනවල පද්ධති සහ ක්‍රියාවලි ඩිජිටල්කරණය ඇතුළු ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

5. ආර්ථික අර්බුදයේ අන්තර් සම්බන්ධිත ස්වභාවය හේතුවෙන් අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම දුෂ්කර කාර්යයක් බවට පත් වී තිබේ. උදාහරණයක් වශයෙන්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ,රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම, රාජ්‍ය බැංකු සහ මූල්‍ය අංශය, මුදල් හා විනිමය අනුපාත ප්‍රතිපත්ති, සුබසාධන ප්‍රතිපත්ති, ණය ප්‍රතිව්‍යුහගත කිරීම අතර පවතින අන්තර්ක්‍රියා හේතුවෙන්, එක් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයක් ගැනීම වෙනත් ප්‍රතිපත්ති ක්ෂේත්‍ර මත බහුවිධ බලපෑම් ඇති කරයි. එබැවින්, සියලු පාර්ශ්වකරුවන්ගේ පුළුල් මට්ටමේ සහයෝගයක්, ශක්තිමත් සම්බන්ධීකරණයක්, ඵලදායී සන්නිවේදනයක් සහ ප්‍රවේශමෙන් ක්‍රියාත්මක කිරීම තුළින් මෙම ගැඹුරු ආර්ථික අර්බුදයෙන් ශ්‍රී ලංකාව තිරසාර ලෙස මුදවා ගැනීම සඳහා ඉතා සූක්ෂම ලෙස සම්බන්ධීකරණ කළ ප්‍රතිපත්ති මිශ්‍රණයක් අවශ්‍ය වේ.

6. ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සහ ඉදිරි කාලය තුළ රට දෙවන ණය පැහැර හැරීමක් අත්විඳීම වැළැක්වීම සඳහා ඉහළ ආර්ථික වර්ධනයක් සහිත තරඟකාරී, අපනයන-අභිමුඛ, හරිත සහ ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කිරීමට නව ප්‍රතිපත්ති අපේක්ෂා කෙරේ.

....

ආචාර්ය එම්.කේ.සී .සේනානායක

අධ්‍යක්ෂ ජනරාල්

3.0 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	තත්‍ය 2023 රු.	තත්‍ය 2022 රු.	
-	ආදායම් ලැබීම්		1,028,555,191	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
1,028,542,891	බදු නොවන ආදායම් හා වෙනත්	4	1,028,555,191	30,007,245,202	ඒසීඒ-1
1,028,542,891	**මුළු ආදායම් ලැබීම් (අ)**		**1,028,555,191**	**30,007,245,202**	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		70,495,000	68,826,000	ඒසීඒ-3
-	නැන්පතු		189,496	97,518	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		2,987,148	2,552,473	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**73,671,644**	**71,475,991**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,102,226,834**	**30,078,721,193**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		422,422	4,000,000	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**1,101,804,412**	**30,074,721,193**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
46,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	43,342,981	43,817,117	ඒසීඒ-2(ii)
19,220,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	29,166,524	24,694,819	ඒසීඒ-2(ii)
680,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	448,114	539,392	ඒසීඒ-2(ii)
-	පොලී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
66,400,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**72,957,619**	**69,051,328**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	ඒසීඒ-2(ii)
500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	186,000	215,500	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
750,000	හැකියා වර්ධනය	14	-	196,000	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
1,250,000	**මුළු මූලධන වියදම් (උ)**		**186,000**	**411,500**	
	නැන්පතු ගෙවීම්		124,274	83,301	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		3,101,561	2,353,003	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**3,225,835**	**2,436,304**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		76,369,454	71,899,132	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**1,025,434,959**	**30,002,822,061**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		1,025,434,959	30,002,822,061	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසීඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	33,314,798	34,227,117
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම	ඒසීඒ-5/5(ඒ)	7,028,825	6,914,411
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		-
මුළු වත්කම්		40,343,623	41,141,528
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		6,924,422	6,875,231
දේපළ පිරියත හා උපකරණ සංචිතය		33,314,798	34,227,117
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	ඒසීඒ-4	104,403	39,180
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		40,343,623	41,141,528

පිටු අංක 07 සිට 28 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම පිටු අංක 7 සිට 59 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ගණකාධිකාරි (රා.ආ)
නම : කේ.එම්. මහින්ද සිරිවර්ධන	නම : ආචාර්ය එම්.කේ.සී සේනානායක	නම : කේ.එස්.එම්. ද සිල්වා
තනතුර : ලේකම්	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	තනතුර : අධ්‍යක්ෂ
දිනය : 2024.02.	දිනය : 2024.02.	දිනය : 2024.02.21

කේ.එම්. සිරිවර්ධන
ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
කොළඹ 01.

Dr. M.K.C. Senanayake
Director General
Department of Fiscal Policy

කේ.එස්.එම්. ද සිල්වා
අධ්‍යක්ෂ
මුදල් ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තතාය	
	2023	**2022**
	රු.	රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,419,187	2,365,283
අග්‍රිම ලැබීම්	70,495,000	68,826,000
අත්තිකාරම් අයකර ගැනීම්	3,446,394	2,465,366
තැන්පතු ලැබීම්	189,496	97,518
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**76,550,077**	**73,754,167**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	68,772,309	66,367,091
සහනාධාර සහ මාරුකිරීම්	448,114	539,392
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,623,194	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	422,422	4,000,000
අත්තිකාරම් ගෙවීම්	2,973,765	2,353,003
තැන්පතු ගෙවීම්	124,274	83,301
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**76,364,077**	**73,342,787**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**186,000**	**411,380**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොලී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	120
උපණය අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**120**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	186,000	411,500
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**186,000**	**411,500**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(186,000)**	**(411,380)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේය වේ

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශයට ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිනුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතන ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා සමාන දෑ</u>

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වලින් සමන්විත වේ

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට ආදාළ ගිනුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය -

රු. ,000

ආදයම් ක්ෂේතය	ආදායම් ක්ෂේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස
	1002.10.00			12,300	
	2005.01.00		1,028,542,891	1,028,542,891	100%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	81,300	83,800	72,958	87.06%
ප්‍රාග්ධන	1,250	1,250	186	14.88%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - අදාළ නොවේ.

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	28,914,798	28,914,798		100%
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/B/DFP/14/23/02	මබේ අංකය / உமது இல. / Your No. }	දිනය / திகதி / Date } 2024 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරි

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2. 1 ආදායම් කළමනාකරණය

2.1.1 හිඟ ආදායම් අය කර ගැනීම

2022 දෙසැම්බර් 31 දිනට හිඟ සමාජ වගකීම් බද්ද ලෙස ගිණුම්ගත වූ රු.63,527,426 ක් 2023 වර්ෂයේ ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය වශයෙන් ඉදිරියට ගෙන ඒමේදී රු.685,225 ක් අඩුවෙන්, රු.62,842,201 ක් ලෙස ඒසීඒ -1 (i) හි සටහන් කර තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා 2023 වර්ෂයේදී වෙන්කරන ලද එකතුව රු.8,800,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.5,175,127 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී පැවතුණි. එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 ක් හා සියයට 100 ක් වී තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයන් 02 කට අදාළව මුල් ඇස්තමේන්තු එකතුව වූ රු.4,000,000 ක් සඳහා මූ.රෙ.66 මඟින් එකතුව රු.2,350,000 ක් එනම් මුල් ඇස්තමේන්තුවෙන් සියයට 56 හා සියයට 63 කින් ප්‍රතිපාදන වැඩිකර ගෙන තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කල යුතු ක්‍රියාකාරකම්වල ප්‍රතිදානය (Output) හා ප්‍රතිඵලය (Outcome) සඳහන් කර නොතිබුණි. එම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

3.1.2. කාර්යභාරයන් ඉටු කිරීම

අපේක්ෂිත ආර්ථික හා සමාජයීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අදාළ ආයතන, රේඛීය අමාත්‍යාංශ සහ පෞද්ගලික අංශය සමග මනා සම්බන්ධීකරණයෙන් යුතුව රජයේ පුළුල් සංවර්ධන රාමුව තුල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූලික වගකීම ලෙස හඳුනාගෙන තිබුණු අතර රටේ බදු ප්‍රතිපත්තිය සැකසීම මෙන්ම ආදායම්, වියදම් සහ මූල්‍ය විශ්ලේෂණය හා දේශීය සහ විදේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්තියෙහි සුදුසු පරිදි වෙනස්කම් සිදු කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම ලෙස හඳුනාගෙන තිබුණි.

2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත මඟින් රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් පාලනය මූලිකව සිදු කරනු ලබන අතර, මෙම පනතේ පරමාර්ථ ඉටු කර ගැනීම සම්බන්ධව 2019 සිට 2023 වර්ෂය දක්වා ආණ්ඩුවේ ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම පිළිබඳ පහත සඳහන් දර්ශක 2 ක ප්‍රගතිය පහත පරිදි විය.

වර්ෂය	2019	2020	2021	2022	2023
අයවැය පරතරය - දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට	9.6	11.1	11.7	10.2	8.3
රාජ්‍ය ණය - දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට	81.9	96.6	100.1	114.2	103.9

ඉහත කරුණු පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව අයවැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන බවට වගබලා ගත යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය වන විට එය සියයට 8.3 ක් වී තිබුණි.

(ආ) 2013 හා 2021 සංශෝධිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව ආණ්ඩුවේ මුළු බැරකම් ඒ මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට අසූවක් නොඉක්මවන බවට සහතික විය යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී එය සියයට 103.9 ක් වී තිබුණි.

(ඇ) 2003 අංක 03 දරන ඉහත පනත යටතේ නිකුත් කරනු ලබන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවේ, මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව අනුව රජයේ පුරෝකථන හෙළිදරව් කිරීමක් වාර්ෂිකව සිදු කරයි. මේ අනුව 2023 වර්ෂයේ නිකුත් කරනු ලැබූ මූල්‍ය කළමනාකරණ වාර්තාවන්හි හෙළිදරව් කරන ලද මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් සලකා බැලීමේදී දර්ශක දෙකක පුරෝකථනය කරන ලද දත්ත හා සත්‍ය දත්ත පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව අනුව 2023 වර්ෂය සඳහා රජයේ ප්‍රමුඛතාවන්	සත්‍ය අගයයන් (වර්ෂයේ සාමාන්‍ය)
* 2023 වසර වන විට ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ 2024 වසර වන විට සියයට 3.5 ට වැඩි ආර්ථික වර්ධනයක් සහ ඉන් ඔබ්බට සියයට 5-6 ක පරාසයක පවත්වා ගැනීම.	-2.3
* උද්ධමනය තනි ඉලක්කමක් වෙත එළඹීම.	17.4

මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2023 වර්ෂය වන විට ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ 2024 වසර වන විට සියයට 3.5 ට වැඩි ආර්ථික වර්ධනයක් සහ ඉන් ඔබ්බට සියයට 5-6 ක පරාසයක පවත්වා ගැනීම රජයේ ප්‍රමුඛතාවක් හැටියට හඳුනාගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ආර්ථික වර්ධනය -2.3 ක් (සෘණ 2.3) ක් විය.

(ii) සමාලෝචිත වර්ෂයේදී උද්ධමනය තනි ඉලක්කමක් වෙත එළැඹීම ප්‍රමුඛතාවක් වුවද එය 17.4 ක් වූ අගයක් ගෙන තිබුණි.

මේ අනුව සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ සඳහන් පරමාර්ථ හා මධ්‍යකාලීන සාර්ව මූල්‍ය ක්‍රමෝපායයන් ඉටු වී නොතිබුණ බව නිරීක්ෂණය විය.

3.1.3 ණය කළමනාකරණ නියෝජිතායතනයක් ස්ථාපිත කිරීම

දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය අනුපාතය අඩු කිරීමට සහ විචක්ෂණ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා තිරසර ණය කළමනාකරණ උපායමාර්ග සකස් කිරීම අරමුණු කර ගනිමින් ණය කළමනාකරණ නියෝජිතායතනය (PDMA) ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම ආයතනය පිහිටුවා නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.1.4 අයවැය යෝජනා ප්‍රගතිය

2023 වර්ෂය සඳහා සමස්තයක් ලෙස අයවැය යෝජනා 120 ක් ඉදිරිපත් කර තිබුණ අතර, එම අයවැය යෝජනාවන්ට ආදායම් යෝජනා 32 ක් ද, වියදම් යෝජනා 30 ක් ද, ප්‍රතිපත්තිමය යෝජනා 58 ක් ද ඇතුළත් වී තිබුණු අතර, එම අයවැය යෝජනා සඳහා මුළු ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන 49,480 ක් විය. ඒ පිළිබඳව පහත සඳහන් විගණන නිරීක්ෂණයන් කෙරේ.

(අ) අයවැය යෝජනා අංක 47.2 යටතේ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන (Social Safety Nets Programme) සඳහා ඉහත මුළු යෝජිත ප්‍රතිපාදන මුදල වූ රුපියල් මිලියන 49,480 න් රුපියල් මිලියන 43,000 ක් හෙවත් මුළු අයවැය යෝජනාවල ප්‍රතිපාදනවලින් සියයට 86.9 ක් වෙන් කර තිබුණි.

(ආ) මුළු අයවැය යෝජනා 120 අතරින් 2023 දෙසැම්බර් 31 දිනට ආදායම් යෝජනා 27 ක් සහ ප්‍රතිපත්ති යෝජනා 14 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර, ආරම්භ කර ක්‍රියාත්මකව පවත්නා යෝජනා සංඛ්‍යාව 70 ක් විය. එහි ආදායම් යෝජනා 5 ක් වියදම් යෝජනා 30 ක් හා ප්‍රතිපත්තිමය යෝජනා 35 ක් බව නිරීක්ෂණය විය.

(ඇ) 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇතැම් අයවැය යෝජනා වසර කිහියපක් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු යෝජනා වුවද, නිශ්චිත කාල රාමුවක් රහිතව යෝජනා සඳහා වන මුළු ප්‍රතිපාදනයම අදාළ වර්ෂයට පමණක් සීමා වන පරිදි ඉදිරිපත් කර තිබුණි.

(ඈ) 2023 වර්ෂයේදී ඉදිරිපත් කර තිබූ වියදම් යෝජනා සියල්ලම 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කර නිම කිරීමට නොහැකි වී තිබුණි. මුළු අයවැය යෝජනාවල ඇතුළත් වියදම් යෝජනාවලින් සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන සඳහා වෙන් කළ ප්‍රතිපාදනය හැරුණු විට ඉතිරි වියදම් යෝජනා 29 සඳහා වෙන් කළ මුළු අයවැය ප්‍රතිපාදනය වූ රු.මි.6,380 න් රු.මි.3,351 ක් හෙවත් සියයට 52 ක් පමණක් වූ මූල්‍ය කාර්යසාධනයක් පෙන්වා තිබුණි.

(ඉ) **වියදම් යෝජනා ක්‍රියාත්මක කිරීම**

(i) අයවැය යෝජනා යටතේ වූ වියදම් යෝජනා 30 අතරින් එකතුව රු.මිලියන 860 ක අයවැය ප්‍රතිපාදන සහිත යෝජනා 09 ක්, 2023 වර්ෂය තුළ කිසිදු මූල්‍ය ප්‍රගතියක් ළඟා කරගෙන නොතිබුණි.

(ii) 2023 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු රුපියල් මිලියන 360 ක ප්‍රතිපාදන එකතුවකින් යුක්ත වූ වියදම් යෝජනා 03 ක මූල්‍ය ප්‍රගතිය ශුන්‍ය වී තිබුණි.

(iii) අයවැය යෝජනා අංක 66.1 යටතේ යෝජනා කර තිබූ රුපියල් මිලියන 50 ක ඇස්තමේන්තුවක් සහිත විදේශ රැකියා සඳහා තරුණයින් පුහුණු කිරීම (Training of Youth for Foreign Employment) ක්‍රියාවට නැංවීමට ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයට පැවරී තිබූ නමුත් මෙම යෝජනාවට අදාළ කිසිදු කාර්යයක් එම අමාත්‍යාංශය විසින් ආරම්භ කර නොතිබුණි.

(ඊ) **ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම**

(i) 2023 වසරේ අයවැය යෝජනා අතරින් ප්‍රතිපත්ති යෝජනා 09 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ii) කාලීන අවශ්‍යතාවයක් වන අයවැය යෝජනා අංක 28.1 මඟින් යෝජනා වී ඇති රජයේ ආදායම කළමනාකරණය සඳහා බදු ව්‍යුහයේ සිදුවිය යුතු වෙනස්කම් පිළිබඳ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ යෝජනාව ද ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

(උ) පසුගිය වර්ෂවල ඉදිරිපත් කළ අයවැය යෝජනා පිළිබඳව පසුවිපරම් සිදු කිරීම සඳහා 2022 වර්ෂයේ අයවැය යෝජනා තුළ අන්තර්ගත වූ ප්‍රතිපත්ති යෝජනා අංක 71.1 අනුව කාර්යසාධන බලකායක් පිහිටුවීමට යෝජනා වී තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දක්වා එම කාර්යාසාධන බලකාය පිහිටුවා නොතිබුණි. මේ අනුව වාර්ෂිකව අලුතින් අයවැය යෝජනා ඉදිරිපත් කිරීමක් සිදු වුවද, පසුගිය වර්ෂවල ඉදිරිපත් කර තිබුණු අයවැය යෝජනා පිළිබඳ ප්‍රගතිය මැන බැලීමක් සිදු කිරීමට ක්‍රියා පිළිවෙතක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබුණි.

(ඖ) 2022 වර්ෂයේ ප්‍රතිපත්ති යෝජනා අංක 5:4:10 යටතේ සඳහන් කර තිබූ පරිදි අයවැය යෝජනාවල අපේක්ෂිත ප්‍රගතිය සිදුවන්නේ දැයි පසුවිපරම් කිරීමේ කාර්යය ක්‍රියාත්මක කර ඇගයීමක් කර නොතිබුණි. 2022 වර්ෂයේ වූ මුළු අයවැය යෝජනා 151 ක් අතරින් වර්ෂය අවසන් වන විට සම්පූර්ණ තත්වයේ පැවති යෝජනා සංඛ්‍යාව 12 ක් තරම් වූ අඩු සංඛ්‍යාවකට සීමා වී තිබුණි. එසේම, 2023 වර්ෂයේ ඉදිරිපත් කරන ලද මුළු අයවැය යෝජනා 120 අතුරින් යෝජනා 41 ක් පමණක් අවසන් තත්වයට පත්වී තිබුණි. මේ අනුව වාර්ෂිකව අයවැය යෝජනා රාශියක් එළිදැක්වෙන නමුත්, අයවැය යෝජනා ක්‍රියාත්මක කරන ආයතන හා අධීක්ෂණ ආයතනවල පවතින දුර්වල කාර්යසාධනය හා පසුවිපරමක් නොමැති වීම සහ එක් එක් වර්ෂයන් තුළ ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අදාළ නිශ්චිත කාලරාමුවක් සකස් කිරීමේ වැඩපිළිවෙලක් නොමැති වීම හේතුවෙන් වාර්ෂිකව අයවැය යෝජනා රාශියක් අලුතින් එකතු වීමක් පමණක් සිදුවන නමුත් ඉදිරිපත් කරනු ලබන අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ සාර්ථක ප්‍රගතියක් ළඟාවීමක් සිදු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වාදීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018. හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්ව, මිල සැඳහුම් ක්‍රමයට ප්‍රසම්පාදන කිරීමේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කළ යුතු වුවද, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකර 2023 වර්ෂයේදී අවස්ථා 09 ක දී එකතුව රු.3,330,175 ක් වූ භාණ්ඩ ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීමෙන් තොරව මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

3.3.1. 2023 දෙසැම්බර් 31 දින වන විට මුදල් අමාත්‍යාංශය වෙතින් විධිමත් පවරාගැනීමකින් තොරව වාහන 03ක් ලබාගෙන තිබුණි.

4. කළමනාකරණ දුර්වලතා

ආදායම් රැස් කිරීම සම්බන්ධ 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 4(ආ) ඡේදය සහ මු.රෙ. 128(2)(ඉ) ප්‍රකාරව රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන සැලසිය යුතු බව දක්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව ආදායම් රැස් කරන ප්‍රධාන ආයතන විසින් 2023 දෙසැම්බර් 31 වන විට රැස් කළ යුතු මුළු හිඟ ආදායම (බදු ආදායම සහ බදු නොවන) රු.714,989,620,126 ක් වී තිබුණි. පසුගිය වසරට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ හිඟ ආදායම් රු.128,986,232,809 ක අඩු වීමක් පෙන්නුම් කළ ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු හිඟ අදායම රු.117,512,309,997 ක වැඩිවීමක් සිදුවී තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

2023 දෙසැම්බර් 31 දින වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් තනතුරු 11 ක් පුරප්පාඩු වී පැවැති අතර, ඉන් තනතුරු 04ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය.

බී.ඔ.ඩී.ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4.0 කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

<table>
<tr><td rowspan="2">නිශ්චිත දර්ශක</td><td colspan="3">තත්‍ය ප්‍රතිදානය අපේක්ෂිත ප්‍රතිදානයේ ප්‍රතිශතයක් ලෙස</td></tr>
<tr><td>100%-90%</td><td>75%-89%</td><td>50%- 74%</td></tr>
<tr><td>01. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය උපාය මාර්ගය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.</td><td colspan="3"></td></tr>
<tr><td>i. ආදායම් හා වියදම්වල කාර්යසාධනය සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය</td><td colspan="3">අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි</td></tr>
<tr><td>ii. රටේ සාර්ව මූල්‍ය තත්ත්වය සමාලෝචනය</td><td colspan="3">අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි</td></tr>
<tr><td>iii. ආර්ථික ප්‍රතිපත්තියෙහි දිශානතිය කෙරෙහි බලපෑනු ලබන අදාළ ආයතන සමඟ සහයෝගීතාව පවත්වා ගැනීම.</td><td colspan="3">අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි</td></tr>
<tr><td>iv. මාසිකව, කාර්තුමය වශයෙන් හා වාර්ෂිකව අයවැය ඉදිරි දැක්ම පිළියෙල කිරීම සහ මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුව පිළියෙල කිරීම</td><td colspan="3">100%</td></tr>
<tr><td>v. තත්ත්වයන්ට අනුගත වීමට ප්‍රතිචාර අවශ්‍ය අවස්ථාවලදී නිසි පියවර ගැනීම</td><td colspan="3">100%</td></tr>
<tr><td>02 වර්තමාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සහ සුදුසු ගැලපීම් යෝජනා කිරීම</td><td colspan="3">අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි</td></tr>
<tr><td>03 සාර්ව - රාජ්‍ය මූල්‍ය පර්යේෂණ</td><td colspan="3"></td></tr>
<tr><td>i. ආර්ථිකයේ පවතින ප්‍රධාන ගැටළු පිළිබඳව විශ්ලේෂණාත්මක කාර්යයන්හි නිරත වෙමින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය යෙදවුම් සැපයීම</td><td colspan="3">100%</td></tr>
<tr><td>ii. ආදායම, වියදම් හා මූල්‍යනය, ආදායම් පුරෝකතනය, මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව විශ්ලේෂණය කිරීම</td><td colspan="3">100%</td></tr>
<tr><td>iii. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ඉලක්කයන් ලබා දීම සහ රාජ්‍ය මූල්‍ය අවධානම් හඳුනාගැනීම</td><td colspan="3">100%</td></tr>
<tr><td>iv. විචලතා විශ්ලේෂණය, විචලතා සඳහා හේතු, නිවැරදි කිරීමේ ප්‍රතිපත්ති හා රාජ්‍ය මූල්‍ය නියමයන් සැපයීම</td><td colspan="3">100%</td></tr>
<tr><td>v. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන්හි ආර්ථික හා සාමාජයීය බලපෑම විශ්ලේෂණය කිරීම හා සාර්ව ආර්ථික රාමුව පිළියෙල කිරීම</td><td colspan="3">100%</td></tr>
<tr><td>vi. දත්ත විශ්ලේෂණය හා කෙටි සටහන්/ සංකල්ප පත්‍රිකා/ විශ්ලේෂණ පත්‍රිකා ලිවීම</td><td colspan="3">100%</td></tr>
</table>

vii. පවතින සහ යෝජිත ආදායම් උත්පාදන ප්‍රතිපත්තීන්හි බලපෑම අධ්‍යයනය කිරීම	100%
viii. ආංශික අයවැය, මූල්‍ය ව්‍යුහයන්, වියදම් උපනතීන් සහ අයවැය ඇස්තමේන්තු අධ්‍යයනය හා විශ්ලේෂණය කිරීම සහ විකල්ප අයවැය ප්‍රතිපාදනයන් විශ්ලේෂණය කිරීම	100%
ix. රාජ්‍ය ණය ප්‍රතිපත්තිය විශ්ලේෂණය කිරීම - ණය කළමනාකරණ ව්‍යුහය, ණය සංඛ්‍යාලේඛන, ණය තිරසාරභාවය, රාජ්‍ය ණය කළඹ සඳහා පිරිවැය සහ අවධානම් කලමනාකරණ රාමුව සහ ණය සහ ණය සේවාකරණ ගෙවීම් පුරෝකතනය	100%
x. සතිපතා ආර්ථික වාර්තාව සහ රාජ්‍ය මූල්‍ය විශ්ලේෂණ වාර්තාව සැකසීම	100%
04. 2023 - 2025 ආදායම් ඇස්තමේන්තුව සකස් කිරීම.	
i. එක් එක් ආදායම් රැස්කරන ආයතනවලින් ඇස්තමේන්තු ලබාගැනීම.	100%
ii. ආදායම් ඇස්තමේන්තු ඇගයීම	100%
iii. ආදායම් ඇස්තමේන්තුව අවසන් කිරීම.	100%
05. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සමාලෝචනය	
i. සෑම මසකම භාණ්ඩාගාර ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන මුදල් ප්‍රවාහ පිළිබඳ ආදායම් කාර්යසාධන සමාලෝචන රැස්වීමට සහභාගී වීම	100%
ii. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව වැනි ආදායම් එකතු කිරීමේ ආයතන සඳහා ප්‍රතිපත්තිමය යෙදවුම් ලබාදීම	100%
06. 2023 වසරේ ආදායම් කාර්යසාධනය අධීක්ෂණය	
i. 2023 ආදායම් ඇස්තමේන්තුවල කාර්යසාධනය අධීක්ෂණය කිරීම	අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි
ii. 2023 අයවැයෙන් හඳුන්වා දුන් ප්‍රතිපත්ති සහ පරිපාලන වෙනස්කම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම	අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි
iii. අවශ්‍ය පරිදි බදු ප්‍රතිපත්ති සංශෝධනය කිරීම	100%
iv. පැහැර හරින ලද බදු පිළිබඳව විශ්ලේෂණය කිරීම සහ එවැනි පැහැරහැරීම් අවම කිරීම සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශ පිළියෙල කිරීම	අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි
07. 2024 අයවැය කථාව සකස් කිරීම.	
i. අයවැය රාමුව සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දීම	100%
ii. මහජනතාවගෙන්, පෞද්ගලික අංශය සහ රජයේ ආයතනවලින් අයවැය යෝජනා ලබාගැනීම.	100%

iii. ලබා ගන්නා ලද යෝජනා සරාංශගත කිරීම.	100%
iv. 2023 අයවැයහි සඳහන් ආදායම් යෝජනා ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය	අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි
v. 2024 අයවැය සඳහා ආදායම් යෝජනා විශ්ලේෂණය කිරීම	100%
vi. ආදායම් යෝජනාවලට අදාළව ගැසට් නිවේදන පිළියෙල කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම.	100%
08. 2023 අයවැයෙහි සඳහන් ආදායම් යෝජනා ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය	
i. අදාළ පනත්වලට අවශ්‍ය වන සංශෝධන සහ කෙටුම්පත් ඉදිරිපත් කිරීම.	100%
ii. නීති කෙටුම්පත් සම්පාදකගේ හා නීතිපතිගේ එකඟතාව ලබාගැනීම.	අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි
iii. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම.	අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි
iv. පනත් සහ පනත් කෙටුම්පත් ප්‍රකාශයට පත්කිරීම.	අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි
v. පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම.	අඛණ්ඩව සිදු කරන ක්‍රියාවකි
09. පවතින නීතියට අනුකූලව බදු සහන සහ බදු නිදහස් කිරීම් ප්‍රදානය කිරීම.	
i. අවශ්‍ය පරිදි බදු සංශෝධන සිදු කිරීම	100%
ii. බදු පිළිබඳව වන කාරණා සම්බන්ධයෙන් මහජන, රාජ්‍ය සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන විසින් කරනු ලබන රැස්වීම් නියෝජනය කිරීම	100%
10. ආයතනික හා මූල්‍ය කටයුතු පරිපාලනය	100%
11. 2003 අංක 3 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත අනුව වාර්තා පිළියෙල කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම	
i. වාර්ෂික අයවැය තත්ත්ව වාර්තාව) - වාර්ෂික වාර්තාව(	100%
ii. වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව	100%
iii. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව	100%
iv. පෙර මැතිවරණ අයවැය තත්ත්ව වාර්තාව	අදාළ නොවේ*
v. තොරතුරු දැනගැනීමේ වාර්තා	100%
12. පාර්ලිමේන්තු/ අමාත්‍ය මණ්ඩල කටයුතු	

i. අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සහ නිර්දේශ සකස් කිරීම	100%
ii. පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා නිරීක්ෂණ සකස් කිරීම	100%
iii. පාර්ලිමේන්තු කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම	100%

★ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් පමණි

5.0 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශන	අදාළ දිනට ළඟා කරගත් ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
ප්‍රමාණවත් සහ පිරිසිදු බලශක්තිය	වසර 2030 වනවිට ගෝලීය බලශක්ති මිශ්‍රනයේ පුනර්ජනනීය බලශක්තියේ කොටස සැළකිය යුතු ලෙස වර්ධනය කර ගැනීම	පුනර්ජනනීය බලශක්ති විශේෂ ව්‍යාපෘති ප්‍රදානය කරන ලද බදු නිදහස් කිරීම් අඛණ්ඩව ලබා දීම.			75% - 100%
සුනිසි රැකියා සහ ආර්ථික වර්ධනය	ජාතික වශයෙන් පවතින තත්ත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය නොනැසී පවත්වා ගැනීම සහ ඌන සංවර්ධන රටවල දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය වාර්ෂිකව 7% ක අගයකවත් පවත්වා ගෙන යාම	අඛණ්ඩව කාර්තු 6 ක ආර්ථික සංකෝචනයෙන් පසුව 2023 වසරේ තුන්වන කාර්තුවේ දී සියයට 1.6 ක ධනාත්මක ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇති අතර, 2023 වසරේ හතරවන කාර්තුවේ ධනාත්මක වර්ධනයක් අපේක්ෂා කෙරේ. තවද, 2025 වසරේ දී දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය 2% ත් 3% ත් අතර අගයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.			100%
සාමය, යුක්තිය සහ ශක්තිමත් සංස්ථානය	සියළුම මට්ටම්වල පවතින ආයතන ඵලදායි, වගවන සහ විනිවිදභාවයකින් යුත් ආයතන බවට සංවර්ධනය කිරීම	අංශ අනුව අනුමත අයවැයෙහි කොටසක් ලෙස ප්‍රාථමික රාජ්‍ය වියදම 2023 වර්ෂයේ දී මනා ලෙස කලමනාකරණය කිරීම			75% - 100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය රටෙහි සමහර තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට **පහත පරිදි ආයක වේ.**

- අරමුණු 7 :- සැමට පහසුවෙන් ළඟා කර ගත හැකි විශ්වාසනීය හා නවීන බලශක්ති ලබා දීම.
- අරමුණු 8 :- සියල්ල අන්තර්ගත සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ සහ ඵලදායි රැකියා අවස්ථා සහ සුනිසි රැකියා ප්‍රවර්ධනය කිරීම
- අරමුණු 16 :- තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියල්ල අන්තර්ගත සමාජ ප්‍රවර්ධනය කිරීම, සැම මට්ටමකම සැමට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම සඳහා කාර්යක්ෂම වග වන සියල්ල අන්තර්ගත සංස්ථානයන් ගොඩ නැගීම .

6.0 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	22	18	04
තෘතියික	02	02	00
ද්විතියික	22	19	03
ප්‍රාථමික	14	10	04

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

මෙම දෙපාර්තමේන්තුවේ අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් තනතුරු 11ක් පුරප්පාඩු ව පවතී. එයින් පුරප්පාඩු වූ තනතුරු හතරක් ජ්‍යෙෂ්ඨ කාණ්ඩයට අයත් වන අතර එය ඉතිරි නිලධාරීන්ගේ කාර්ය භාරයට අහිතකර ලෙස බලපානු ඇත.

පවතින කාර්ය මණ්ඩලය තුළ නිවැරදි ලෙස උපයෝජනය කර කළමනාකරණය කර ගන්නා ලදී.

6.3 මානව සම්පත් සංවර්ධනය

6.3.1 දේශීය පුහුණු

මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 ජනවාරි 27 දිනැති භාණ්ඩාගාර චක්‍රෙල්ඛ 1/2023 අනුව 2023 වර්ෂයේ සියයට 6 ක පුනරාවර්ථන වියදම් සීමා කිරීම මැයෙන් වූ චක්‍රලේඛයේ විදි විධාන අනුව දේශීය පුහුණු සඳහා යොමු කිරීමට අවස්ථාව නොසැලසුනි.

පුහුණු පාඨමාලාව	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය	වැඩසටහනේ ස්වභාවය	නිමැවුම / ලබා ගත් දැනුම
නැත					

6.3.2 විදේශ පුහුණු

විදේශ පුහුණු / වෘත්තීය සංචාරය

2023.01.01 සිට 2023.12.31 දක්වා

අනු.	නම	තනතුර	වැඩසටහන	රට	පුහුණු / ගමන් කාලය	වියදම		
						අනියම් දීමනා	ගමන් රක්ෂණය	වීසා ගාස්තු
1	ආචාර්ය එම්.කේ.සී. සේනානායක මහතා	අධ්‍යක්ෂ ජනරාල්	2023 Spring Meetings of the International Monetary Fund & World Bank Group	ඇමරිකා	10.04.2023 - 16.04.2023	US $ 360 Air Ticket - රු. 886,600.00	රු. 5,826.85	-
			Asia Pacific Tax Forum	ඉන්දුනීසියාව	03.05.2023 - 05.05.2023	US $ 100	රු. 2,582.99	-
			International Monetary Fund (IMF) World Bank (WB) Annual Meetings	මොරොකෝ-කෝව	13.10.2023 - 15.10.2023	US $ 400 Air Ticket - රු. 576,600.00	රු. 4,761.28	-
2	එම්.ආර්.ජී.ඒ.බී. මුතුකුඩේ මහතා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	Seminar on Bank Regulation and Financial Risk Prevention for Developing Countries	චීනය	03.11.2023 - 16.11.2023	US $ 375	රු. 5,495.34	-
3	බී.එන්. ගමගේ මිය	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	Workshop on Innovative Tax Administration	ජපානය	27.03.2023 - 29.03.2023	US $ 125	-	-
4	ඩී. විජේවර්ධන මහතා	අධ්‍යක්ෂ	South Asia Regional Training on Economic Analysis of Investment Projects	බංගලාදේශය	18.09.2023 - 21.09.2023	US $ 125	රු. 3,345.13	-
5	ඩබ්.ටී.ඒ. පෙරේරා මෙනෙවිය	Tax Policy Advisor	Tokyo Fiscal Forum 2023	ජපානය	06.06.2023 - 07.06.2023	US $ 100	රු. 3,049.54	රු. 4,100.00
6	ජේ.ඩී. කොටින්කඩුව මෙනෙවිය	අධ්‍යක්ෂ	Regional Workshop on Tax Expenditures	පිලිපීනය	28.02.2023 - 04.03.2023	-	-	-
			IMF SARTTAC Training Course on Balance Sheet Approach - Invitation for Participation	ඉන්දියාව	21.08.2023 - 25.08.2023	රු. 49,423.50	රු. 3,518.60	-
7	ඩබ්.ඒ.ජේ.සී. වික්‍රමආරච්චි මෙනෙවිය	අධ්‍යක්ෂ	Seminar on VAT Management & Reform for Belt & Road Countries - AIBO	චීනය	14.06.2023 - 27.06.2023	රු. 113,898.75	රු. 5,495.34	-
			Invitation to the Workshop on Inter - Country Learning for Implementing High - Impact Interventions	තායිලන්තය	22.08.2023 - 25.08.2023	රු. 49,438.50	රු. 3,166.26	-
			Conference on Public Finance for Inclusive and Sustainable Development : the role of Strategic Budget Initiative and Fiscal Policy	තුර්කිය	28.11.2023 - 29.11.2023	US $ 75	රු. 3,539.17	රු. 87,342.00

8	පී.ඒ.එන්. අබේසේකර මෙනෙවිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Seminar on Tax Certainty for Belt & Road Countries - AIBO	චීනය	06.06.2023 - 19.06.2023	US $ 375	රු. 4,561.85	-
9	එම්.ඒ.එස්. දබරේරා මෙනෙවිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Financial Developing & Financial Inclusion	ඉන්දියාව	10.04.2023 - 20.04.2023	රු. 107,432.00	රු. 4,096.51	-
			Invitation to the Workshop on Inter - Country Learning for Implementing High - Impact Interventions	තායිලන්තය	22.08.2023 - 25.08.2023	රු. 49,438.00	රු. 3,166.26	-
10	එම්.ඒ.එස්. මදුශංක මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Economic Policy Seminar 2023	ජපානය	18.05.2023 - 09.06.2023	රු. 118,567.50	රු. 5,261.86	-
11	පී.එස්. කුමාරගුරු මිය	සහකාර අධ්‍යක්ෂ	IMF SARTTAC Training on Macroeconomics of Climate Change	ඉන්දියාව	24.04.2023 - 04.05.2023	රු. 98,553.00	රු. 4,096.51	රු. 4,388.00
12	ජේ.ජී.ඩී. තාරකා මෙනෙවිය	සහකාර අධ්‍යක්ෂ	IMF SARTTAC Training Course on Advanced Government Finance Statistics	ඉන්දියාව	16.10.2023 - 20.10.2023	US $ 150	රු. 3,166.26	රු. 4,388.00
13	අයි.එස්. ජයමාන්නේ මෙනෙවිය	සංවර්ධන නිලධාරී	Seminar on Tax Certainty for Belt & Road Countries - AIBO	චීනය	06.06.2023 - 19.06.2023	US $ 375	රු. 5,495.34	රු. 2,268.00
14	ඩබ්.කේ.එස්. රෝෂිනි මිය	සංවර්ධන නිලධාරී	Seminar on VAT Management & Reform for Belt & Road Countries - AIBO	චීනය	14.06.2023 - 27.06.2023	රු. 113,898.75	රු. 5,495.34	-
15	ටී.එන්.එන්. කූරේ මිය	සංවර්ධන නිලධාරී	Seminar on VAT Management & Reform for Belt & Road Countries - AIBO	චීනය	14.06.2023 - 27.06.2023	රු. 113,898.75	රු. 5,495.34	-
16	ඩබ්.එන්.ආර්. චන්දමා ලලනි මිය	සංවර්ධන නිලධාරී	IMF SARTTAC Training on Nowcasting	ඉන්දියාව	18.09.2023 - 29.09.2023	රු. 115,108.31	රු. 5,495.34	රු. 4,388.00
17	වයි.එන්.සී. ද සිල්වා මිය	සංවර්ධන නිලධාරී	Seminar on VAT Management & Reform for Belt & Road Countries - AIBO	චීනය	14.06.2023 - 27.06.2023	රු. 113,898.75	රු. 4,561.85	-
18	පී.එම්.එන්. සම්මානි මිය	සංවර්ධන නිලධාරී	IMF SARTTAC Training on Introduction to Government Finance Statistics - Invitation for Participation	ඉන්දියාව	28.08.2023 - 01.09.2023	රු. 57,685.25	රු. 3,166.26	රු. 4,388.00
19	සී.කේ. විතාන මිය	සංවර්ධන නිලධාරී	Seminar on Banking and Finance for Developing Countries	චීනය	13.09.2023 - 26.09.2023	රු. 122,851.80	රු. 5,495.34	-

7.0 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)		අදාළ නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්		අදාළ නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	තිබීම			
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අර්ධ වශයෙන් අනුකූල වේ	තුන් වන හා හතර වන කාර්තු අවසන් කර ඇත.	ඉදිරියේදී අදාළ වාර්තා නියමිත දිනට යැවීම සඳහා කටයුතු කරනු ලැබේ.
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	ඉන්ධන ලබා දීම සීමාකිරීම හේතුවෙන් මෙම කාර්යය සිදු කිරීමට නොහැකි විය.	ඉදිරියේදී නියමිත පරිදි කාර්යය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම			
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		ඉදිරියේ දී නිසි පරිදි සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		